# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,645 — 1959 ජනවාරි 23 වැනි සිකුරාද – 23.1.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (II) වැනි ඡේදය – පළකිරීම්

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)



| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... | 161 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... | 165 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටැන්ඩර් කැඳවීමේ දැන්වීම් ... | — | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් | — |
| තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම් | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... | — |
| බඩු බාගිරාදිය විකිණීම ... ... | — | විවිධ දැන්වීම් ... ... | — |



## තනතුරු – ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී, ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කායසි සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වූන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය"යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත්, එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූල ව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවාවෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද, නැද්ද යනු පරීක්‍ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්‍ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. නවප්‍රවේශක නිලධාරීනු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්‍ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්‍ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතු ය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්‍ෂණයකින් සමත්වීම, ආධුනික/පරීක්‍ෂා කාලය අවසන් වීමෙන් පසු එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්‍ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ" යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත්, එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්‍ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම, එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

161—ජේ. ඇන්. බී. 10913—5,780 (1/59)

## මධ්‍ය මහා විද්‍යාලයවල ශිෂ්‍ය නිවාසාධිකාරී (ගැහැණු) තනතුරු

මධ්‍ය මහා විද්‍යාලයවල ශිෂ්‍ය නිවාසාධිකාරී (ගැහැණු) තනතුරු සඳහා පහත දී තිබෙන ආදර්ශ පෝරමය අනුව පිළියෙළ කළ අයදුම් පත් අධ්‍යාපනාධ්‍යක්ෂවරයා විසින් භාරගනු ලැබේ. 1959 පෙබරවාරි 20 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් අධ්‍යාපනාධ්‍යක්ෂවරයාට ලැබෙන සේ, "අධ්‍යාපනාධ්‍යක්ෂ, පාලන ශාඛාව, මලයි විදිය, කොළඹ 2" යන ලිපිනයට එවිය යුතු ය.

2. **වැටුප් හා දීමනා.**—(i) මේ තනතුරට හිමි වාර්ෂික වැටුප රුපියල් 1,464න් පටන්ගෙන රුපියල් 72 වාර්ෂික වැඩිවීම් ඇතිව රුපියල් 2,688 තෙක් නගී.

(ii) ගෙවල් කුලී දීමනා ගෙවනු නො ලැබේ. එහෙත් රජයේ රෙගුලාසි අනුව තාවකාලික ජීවනාධාර මුදල් හා විශෙෂ ජීවනාධාර මුදල් ගෙවනු ලැබේ.

3. (i) **සේවාව පිළිබඳ කොන්දේසි.**—මේ තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් රහිත ය. මුලදී පත්වීම තුන් අවුරුදු පෝදිසියකට යටත් වේ.

(ii) තෝරාගනු ලබන අයදුම්කරුවන් විසින් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

4. **අවශ්‍ය අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම—

(i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ජ්‍යෙෂ්ඨ ගෘහ විද්‍යා සහතික පත්‍රය හෝ මේ සහතික පත්‍රවලට සමාන හෝ උසස් හෝ සහතික පත්‍ර දරන බවටත් ;

(ii) ශිෂ්‍ය නිවාස හෝ නවාතැන් හා ආහාර සැපයීමේ ආයතන පාලනය කිරීමේ පළපුරුද්දක් ඇති බවටත් (සාත්තු සේවය පිළිබඳ දැනුමක් ඇති අය ගැන විශෙෂයෙන් සලකා බලනු ලැබේ.) ;

(iii) 1959 පෙබරවාරි 20 වැනි දිනට වයස අවුරුදු 25ට නො අඩු බවටත්, 50ට නො වැඩි බවටත් (දැනට රජයේ සේවයේ නියුතු අය කෙරෙහි වැඩි වයස් සීමාව බල පාන්නේ නැත.) සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

5. **විශෙෂ කොන්දේසි.**—(i) තෝරාගනු ලැබූ අයදුම්කරු පළමුවෙන් ජී/කරන්දෙනිය මධ්‍ය මහා විද්‍යාලයට පත් කරනු ලැබේ. එහෙත් ඇය ලංකාවේ ඕනෑම ස්ථානයකට මාරුකිරීමට යටත් වේ.

(ii) අයදුම් පත් පහත දක්වෙන ආදර්ශ පෝරමය අනුව විය යුතුය. මේ දෙපාර්තමේන්තුවෙන් අයදුම් පත් පෝරම සපයනු නො ලැබේ. දැන්වීමේ දී තිබෙන ආදර්ශ පෝරමය පිටපත් කර ගත යුතු ය.

(iii) තෝරාගනු ලැබූ අයදුම්කරු ශිෂ්‍ය නිවාසයේ පදිංචි විය යුතුය.

6. මේ ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡෙදයෙහි පළ කර තිබෙන රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

ඩී. එච්. ද සොයිසා,
අධ්‍යාපනාධ්‍යක්ෂ වෙනුවට.

අංක ඒබීවී. 448.
1959 ජනවාරි 20 වන දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

### ආදර්ශ පෝරමය

**මධ්‍ය මහා විද්‍යාලයවල ශිෂ්‍ය නිවාසාධිකාරී (ගැහැණු) තනතුරු සඳහා අයදුම් පත**

(1) සම්පූර්ණ නම (අච්චු අකුරෙන්) :————.

(2) ලිපිනය :————.

(3) 1959 පෙබරවාරි 20 වන දිනට සම්පූර්ණ වයස :————.
අවුරුදු———, මාස———, දවස්———.

(4) ජාතිය හා එය හිමි වූ අන්දම :————.

(5) උපන් ස්ථානය :—
(අ) අයදුම්කරු :————.
(ආ) අයදුම්කරුගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා (පියාගේ පියා) : ————.
(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තා (පියාගේ පියාගේ පියා) :————.

(6) අධ්‍යාපන සුදුසුකම්, ඒවා ලබාගත් දින සහිතව (ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම්වල පිටපත් ඇමිණිය යුතු ය.) : ————.

(7) වෘත්තීය සුදුසුකම් :————.

(8) අධ්‍යාපනය ලත් පාඨශාලා හා විද්‍යාල (ඒවාට ඇතුළත් වූ හා ඒවායින් අස්වූ දින සඳහන් කළ යුතු ය) :————.

(9) දැනට කරන රක්ෂාව :————.

(10) ශිෂ්‍ය නිවාස හෝ නවාතැන් හා ආහාර සැපයීමේ ආයතන පාලනය කිරීමේ පළපුරුද්ද :————.

(11) සිංහල/දෙමළ/ඉංග්‍රීසි පිළිබඳ සුදුසුකම් :————.

(12) චරිත සහතික දී ඇති අයගේ නම් සහ තනතුරු (ඥාතීන් නොවිය යුතුය) මෑතදී ලබාගත් චරිත සහතිකවල පිටපත් තුනක් පමණක් අමුණා එවිය යුතු ය. මුල් පිටපත් නො එවිය යුතු ය. දැනට රජයේ සේවයේ යෙදී සිටින්නන්ගෙන් මේ චරිත සහතික අවශ්‍ය නැත) :————.

(13) වෙනත් විස්තර :————.

ම විසින් මේ අයදුම් පතෙහි සඳහන් කර ඇති විස්තර නිවැරදි බවත්, සත්‍ය බවත් මෙයින් සහතික කරමි. තවද, මෙහි සඳහන් කර ඇති යම්කිසි කරුණක් වැරදි හෝ අසත්‍ය හෝ බව පත්වීම දීමට ප්‍රථමයෙන් එළිදරව් වුවහොත් මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමටද, පත්වීම ලැබුනාට පසුව එළිදරව් වුවහොත් කිසිම වන්දි ගෙවීමක් නැතිව මා තිලයෙන් පහකිරීමට ද යටත්වන බව මා දන්නා බවත් මෙයින් ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

---

## ලංකා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

### උප ආරක්ෂක (කියුරේටර්) තනතුර

ලංකා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ උප ආරක්ෂක තනතුරක් සඳහා, ඉල්ලුම් පත්‍ර වර්ෂ 1959 පෙබරවාරි මස 17 වෙනි දින තෙක්, මෙහි පහත සඳහන් ආකෘති පත්‍රයේ ආකාරයට පිළියෙළ කරන ලද පෝර්මයක එවන ලෙස මෙයින් ආරාධනා කරනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—මේ තනතුරට අයත් වාර්ෂික වැටුප රුපියල් 960 න් පටන් ගෙන, වර්ෂයකට රුපියල් 72 බැගින් 24 වරක් වැඩිවී රුපියල් 2,688 තෙක් නගී. එහි රුපියල් 1,608 සහ රුපියල් 2,184 යන මේ වාර්ෂික වැටුප්වලට ප්‍රථමයෙන් කාර්යක්ෂමතා කඩඉම් ඇත්තේ ය.

3. **සේවය පිළිබඳ කොන්දේසි.**— මේ තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—එක් එක් අයදුම්කරුවන් (අ) තමා ලාංකිකයකු බවටත්, (ආ) තමාගේ වයස අවුරුදු 21 වත් 35 වත් අතර බවටත් (දැනට රාජ්‍ය සේවයෙහි නියුක්ත අය වැඩි වයස් සීමාව වූ අවුරුදු 30 ඉක්ම වා සිටිතත් එබඳු අයගේ ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ.)

(ඉ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට උසස් හෝ ඊට සමාන හෝ විභාගයකින් සමර්ථ වූ බවටත්, ලංකාද්වීපයේ ප්‍රාණි විද්‍යාව, ඉතිහාසය හා සංස්කෘතිය පිළිබඳ සාමාන්‍ය දැනීමක් ඇති බවටත්, ඉංග්‍රීසියෙන් හෝ දෙමළෙන් හෝ වැඩ කිරීමේ මනා ශක්තිය ඇති බවටත්,

(ඊ) තමා විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික සනීපයෙන් යුක්ත වූ බවටත් සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතු සි.

**සැලකිය යුතු සි.**—මෙම දෙපාර්තමේන්තුවේ අවුරුදු පහක (5) සේවා කාලයක් ඇති නිලධාරීන්ට පාඨශාලා කණිෂ්ඨ සහතික පත්‍රය තිබේ නම් එවැනි ඉල්ලුම් පත්‍ර ද සලකා බලනු ලැබේ.

5. අයදුම්කරු තමාගේ ඉල්ලුම් පතට පහත සඳහන් **සහතිකවල පිටපත්** (මුල් පිටපත් නොවේ) අමුනා එවිය යුතු සි :—

(අ) උප්පැන්න සහතිකය (ස. ල.—බවුතිස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් කටයුතු සඳහා දෙන උප්පැන්න සහතික පත්‍ර හෝ භාර ගනු නොලැබේ).

(ආ) ලබාගත් උසස් ම අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික පත්‍රය.

(ඉ) තම සුදුසුකම්, චරිතය හා තනතුරට පත්වීමට ඇති යෝග්‍යතාව පිළිබඳ මෑත දී ලබාගත් සහතික දෙකක්.

**සැලකිය යුතු සි.**—සහතික පත්‍රවල හා චරිතය පිළිබඳ සහතික පත්‍රවල පිටපත් ආපසු එවනු නො ලැබේ.

6. නියමිත දිනට පසු ව මෙහි ලැබෙන ඉල්ලුම් පත්‍ර භාර ගනු නො ලැබේ. දැනට රාජ්‍ය සේවාවෙහි සිටින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර නියමිත දිනට පසුව මෙහි ලැබුණොත් ඒ ඉල්ලුම් පත්‍ර ඒ ඒ අයදුම්කරුවන්ගේ ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් වෙත ඒ දිනයට කලින් ලැබුණු බව සඳහන් කර, එම ඉල්ලුම් පත්‍ර ප්‍රමාදවීමට සෑහෙන හේතු දක්වමින් ඒ ප්‍රධානීන් එම ඉල්ලුම් පත්‍ර භාර ගන්නා ලෙස නිර්දේශයක් කළහොත් පමණක් එසේ ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත්‍ර භාර ගනු ලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ සඳහන්, රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත් කිරීම්වලට අදාල වූ ද පොදු කොන්දේසි බලනු මැනවි.

පී. ඊ. පී. දැරණියගල,
ලංකා ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ.

1959 ජනවාරි 16 වන දින,
ලංකා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 854, කොළඹ 7.

ආදර්ශ ආකෘති පත්‍රය

**ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව**

**උප ආරක්ෂක තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය**

1. (අ) සම්පූර්ණ නම :————.
   (ආ) ජාතිය හා එය ලබාගත් අයුරු :————.

2. ලිපිනය :————.

3. (අ) උපන් දිනය හා වයස :————.
   (ආ) විවාහක ද අවිවාහක ද යන වග :————.

4. උපන් ස්ථානය—
   (අ) අයදුම්කරු :————.
   (ආ) අයදුම්කරුගේ පියා :————.
   (ඉ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ ආතා :————.
   (ඊ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.

5. (අ) අධ්‍යාපනික සුදුසුකම් :————.
   (ආ) වෙනත් සුදුසුකම් :————.

6. පාසැලෙන් අස්වූවාට පසු රැකියාවක යෙදුනේ නම් ඒ පිළිබඳ විස්තර :————.

7. මේ පිළිබඳ ප්‍රවීනත්වය දක්වන්න—
   (අ) ඉංග්‍රීසි :————.
   (ආ) දෙමළ :————.

8. සහතික දෙනු ලබන අයවළුන් දෙදෙනකුගේ නම් සහ ලිපිනය :————.

9. ඉල්ලුම් පත සම්බන්ධයෙන් වෙනත් විශෙෂ ඉල්ලීම් ආදිය පිළිබඳ විස්තර :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

---

අංකය : ඈස්. එච්. 5/59.

**පොලිස් දෙපාර්තමේන්තුව**

**පොලිස් කාන්තාවන් බඳවාගැනීම**

ලංකා පොලිස් සේවයට පොලිස් කාන්තාවන්ගේ තනතුරු සඳහා අයදුම් පත්‍ර භාරගනු ලැබේ. පහත සඳහන් ආකෘති පත්‍රයට අනුකූලව පිළියෙල කරන ලද අයදුම් පත්‍ර වර්ෂ 1959 පෙබරවාරි මස 14 දිනට ප්‍රථම "අධ්‍යක්ෂක තැන, පොලිස් අභ්‍යාස විද්‍යාලය, කළුතර" වෙත ලැබෙන සේ එවිය යුතුයි.

(මෙම ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II) වෙනි ඡේදයේ මුල පළවූ රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි බලනු මැනවි.)

**2. වැටුප් පිළිවෙළ :—**

(අ) පුහුණුවන කාලය තුළදී වාර්ෂික වැටුප රුපියල් 750 ක් හා ජීවන වියදම් දීමනා සහ විශේෂ ජීවන වියදම් දීමනා ආණ්ඩුවේ දීමනා මුදල් ප්‍රමාණයට ගෙවනු ලැබේ.

(ආ) පුහුණු වන කාලය අවසානවූවායින් පසු වාර්ෂික වැටුප් මුදල රුපියල් 840 කින් ආරම්භ වී අවුරුදු පතා රුපියල් 42 බැගින් වැඩිවී අවුරුදු 22 කින් වාර්ෂික වැටුප රුපියල් 1,764 තෙක් නගී.

(ඇ) තෝරා පත්කර ගන්නා ලද අයදුම්කරුවන්ට නොමිලේ—
   (1) වාසස්ථාන,
   (2) නිල ඇඳුම්, සහ
   (3) නිල ඇඳුම් පෙට්ටියක්, කම්බිලි සහ බූට්ස් හෝ සපත්තු සපයනු ලැබේ.

3. මෙම තනතුරු ස්ථිරවූද, විශ්‍රාම වැටුප් රහිතවූ ද ඒවා වෙති. අවුරුදු 3ක් ආධුනිකත්වයේ තබනු ලැබේ. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට සහ දෙපාර්තමේන්තුවේ සෙසු අරමුදල් වලට ද සාමාජික මුදල් ගෙවිය යුතුයි.

**4. අවශ්‍ය සුදුසුකම් :—**

(1) සෑම අයදුම්කරුවෙක්ම පහත දැක්වෙන කරුණු ඔප්පු කිරීමට ලියකියවිලි වලින් සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි—
   (අ) වර්ෂ 1959 පෙබරවාරි මස 14 වැනි දිනට වයස අවුරුදු 19ට නොඅඩු බව හා අවුරුදු 30කට නොවැඩි බව,
   (ආ) යහපත් චරිතයක් ඇති බව, සහ
   (ඇ) අධ්‍යාපනාධ්‍යක්ෂක තුමා විසින් අනුමත කරන ලද පාසැලකින් දෙන ලද පාඨශාලා කනිෂ්ඨ සහතික පත්‍රය හෝ එවැනි පාසැලක ප්‍රධානාචාර්ය වරයෙකු විසින් පාඨශාලා කනිෂ්ඨ සහතික පත්‍රයට සමාන කොට සහතික කරන ලද අටවැනි පඞක්තියෙන් සමර්තවී ඇති බව;

(2) අයදුම්කරුවන් යහපත් ශරීර සෞඛ්‍යයක්ද, මනා කායික ශක්තියක් හා ඉතා හොඳ දෘෂ්ටියකින්ද යුක්තවිය යුතුයි. උස අඩි 5කට අඩු නොවිය යුතුයි.

(3) අයදුම්කරුවන් අවිවාහක විය යුතු බව සහ ඔවුන්ගේ පත්වීම ස්ථිර වන තුරු අවිවාහකව සිටිය යුතුයි.

(4) සෑම අයදුම්කරුවෙකුම ලාංකිකයෙකු විය යුතුයි. (වර්ෂ 1948 අංක 18 දරණ ලංකාපුරවැසි පණත අනුවයි.)

(5) අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතික පිටපත් (මුල් පිටපත් නොවේ) අයදුම්පත් වලට අමුනා එවිය යුතුයි :—
   (අ) උප්පැන්න සහතිකය.
   (ආ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය, සහ
   (ඇ) චරිතය පිළිබඳ මෑතදී ලබාගත් සහතික පත්‍ර 3 ක්— මේවායේ මූලික පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුයි.

ඈස්. ඩබ්ලිව්. ඕ. ද සිල්වා,
පොලිස් පති.

1959 ජනවාරි මස 19 දින,
කොළඹ ප්‍රධාන පොලිස් කාර්‍යාලයේදීය.

ආකෘති පත්‍රය

**පොලිස් කාන්තා තනතුර සඳහා අයදුම් පත්‍රයයි**

(මෙම ආකෘති පත්‍රය ප්‍රවේසම් සහිතව පිටපත් කරගත යුතුයි)

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
2. ස්ථිර ලිපිනය :————.
3. උපන් දිනය :————.
   1959 පෙබරවාරි මස 14 වැනි දිනට වයස :————.
4. අධ්‍යාපනික සුදුසුකම් :—
   සමත්වී ඇත්තේ කුමන විභාගයකින් ද? විශයයන් සඳහන් කරනු :————.
5. විවාහකද, අවිවාහකද යන බව :————.
6. උස :————.
7. ඔබ දැනට වෘත්තියක යෙදීසිටින්නෙහිද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.
8. පියාගේ සම්පූර්ණ නම සහ රක්ෂාව :————.
9. ඔබගේ කිසියම් නෑදෑයෙක් නඩු හබවලට පැටලී, කැඳවා හෝ චෝදනා කර හෝ කිසියම් වරදකට වැරදිකරුවී තිබේද? එසේ නම් එහි විස්තර සඳහන් කරනු :————.
10. ඔබ මෙයට පෙර පොලිස් කාන්තා සේවයට බැඳීම සඳහා ඉල්ලුම් කර තිබේද? එසේ නම් දිනය සහ එයට ලැබුණ පිළිතුර සඳහන් කරනු :————.

වෙනත් විශෙෂ සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ තොරතුරු :————.

මෙම අයදුම්පත්‍රයේ ඇතුලත් කරන ලද ඉහත සඳහන් විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් කිසියම් විස්තාරයක් අසත්‍ය හෝ වැරදි බව පත්වීම ලැබීමෙන් පසුව එළිවූයේ නම්, එකෙණෙහිම පොලිස් දෙපාර්තමේන්තුවෙහි මාගේ සේවය අවසාන වන බවද දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

ස්ථානය :————.
දිනය :————.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

1/23/7/7 (ජී).

## ටයිප් ගසන්නන්ගේ සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගය—මාර්තු, 1959

1. **විභාගය පවත්වන දින.**—ටයිප් ගසන්නන්ගේ සේවයට බඳවා ගැනීමේ තරඟ විභාගයක්, සිංහලෙන් ටයිප් ගැසීම මැනවින් දත් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම අපේක්ෂකයන් සඳහා 1959 මාර්තු 28 වැනි දින සිට විභාග කොමසාරිස් තැන විසින් කොළඹ දී පවත්වනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—සාමර්ථ්‍යය ලද අපේක්ෂකයෝ රුපියල් 960 න් පටන් ගෙන රුපියල් 72 බැගින් රුපියල් 2,688 දක්වා වැඩි වෙන වාර්ෂික වැටුපක් ඇත්තා වූ ද, රුපියල් 1,608 ට පෙර සහ රුපියල් 2,184 ට පෙර ප්‍රවීණතා බාධක සහිත වූ ද ටයිප් ගසන්නන්ගේ සේවයට පත් කරනු ලබන්නාහ.

3. **සේවාවේ කොන්දේසි.**—(i) සාමර්ථ්‍යය ලද පිරිමි අපේක්ෂකයන් පත්කරනු ලබන දින පටන් තුන් අවුරුදු ආධුනිකත්වය ඇතිව මෙම සේවයට පත්කරනු ඇත. ඔවුන්ගේ තනතුරු විශ්‍රාම වැටුප් සහිත ය. සාමර්ථ්‍යය ලද අපේක්ෂිකාවන් පළමුවෙන් අර්ථ සාධක අරමුදල් ක්‍රමය යටතේ පත්කරනු ඇත. ඔවුන් පත්වීමේ දින සිට අවුරුදු තුනක පරීක්ෂණ කාල සීමාවකට යටත්වනු ඇත. එම අපේක්ෂිකාවන්ට අවුරුදු දහයක සේවය සම්පූර්ණ කිරීමට පෙර, ඕනෑම අවස්ථාවක දී, විශ්‍රාම වැටුප් ලබන තත්ත්වයට පැමිණීමට කැමැත්ත ප්‍රකාශ කළ හැකි ය. එසේ කැමැත්ත ප්‍රකාශ කිරීමෙන් පසුව නැවත එය අවලංගු කළ හැකි නොවේ. පරීක්ෂණ කාල සීමාව තුළ දී එසේ කැමැත්ත දක්වන අපේක්ෂිකාවන්ගේ පත්වීම් ඉන් පසුව ආධුනික තත්ත්වයට පමුණුවනු ලැබේ. එසේ ආධුනික තත්ත්වයේ සිටිය යුතු කාල සීමාව තුන් අවුරුදු පරීක්ෂණ කාල සීමාවෙන් ඉතිරි කොටසට සමාන වනු ඇත.

(ii) මෙම විභාගයේ ප්‍රතිඵල අනුව ටයිප් ගසන්නන්ගේ සේවයට පත්කරනු ලබන අපේක්ෂකයන්ගේ ස්ථාන මාරු කරන්නටත්, ලංකාවේ ඕනෑම තැනකට ඔවුන් පත් කරන්නටත් පිළිවන්කම තිබේ.

(iii) සාමර්ථ්‍යය ලැබ ටයිප් ගසන්නන්ගේ සේවයට පත්කිරීමේ දී, රජයේ භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා "නව ප්‍රවේශකයන්" ලෙස සලකනු ලබන අය විසින්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස—විශේෂයෙන් 1956යේ අංක 33 දරන රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීම පිණිස—මේ දක්වා පනවා ඇති හෝ ඉදිරි කාලයෙහි පැනවිය හැකි හෝ ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතු වේ.

(iv) අතිරේක දීමනා සහ සේවාවේ වෙනත් කොන්දේසි දැන ගැනීම සඳහා මේ "ගැසට්" පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ මුල පළවන ආණ්ඩුවේ සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසි බැලිය යුතු ය.

(v) ටයිප් ගසන්නන්ගේ සේවය සාමාන්‍ය ලිපිකාර සේවයේ කොටසක් නොවේ. එහෙයින් ටයිප් ගසන්නන්ගේ සේවයේ නිලධාරීන්ට සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකාර පංතියට උසස්වීම සඳහා පැවැත්වෙන විභාගයට පෙනී සිටීමට අවසර නැත. එහෙත් ටයිප් ගසන්නන්ගේ සේවයේ පත්වීම් ස්ථිර වූවාට පසු, වයස සහ අධ්‍යාපන සුදුසුකම් ගැන සැලකීමක් නැතිව, ඔවුන්ට ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට ඇතුල්වීමේ විභාගයට පෙනී සිටීමට අවසර දෙනවා ඇත.

4. **සුදුසුකම් : සාමාන්‍ය කොන්දේසි.**—(i) අපේක්ෂකයෝ යහපත් චරිතයෙන් යුක්ත විය යුත්තාහ.

(ii) අපේක්ෂකයෝ ලාංකිකයෝ විය යුත්තාහ.*

(iii) අපේක්ෂකයන්ට පහත දැක්වෙන සහතික පත්‍ර වලින් යටත් පිරිසෙයින් එකක්වත් තිබිය යුතුයි :—

(අ) ලංකා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය ;

(ආ) ලන්ඩන් මැට්‍රිකියුලේෂන් සහතික පත්‍රය හෝ කේම්බ්‍රිජ් සීනියර් සහතික පත්‍රය ;

(ඇ) ලංකා ජ්‍යෙෂ්ඨ ගෘහ්‍ය කර්ම විද්‍යා සහතික පත්‍රය ;

(ඈ) ලංකා කාර්මික විද්‍යාලයේ අවසාන වාණිජ සහතික පත්‍රය ;

(ඉ) ලංකාවේ අපේක්ෂකයන්ට නියමිත පරිපාටිය යටතේ ලන්ඩන් වාණිජ මණ්ඩලයේ (London Chamber of Commerce) වාණිජ අධ්‍යයන සහතික පත්‍රය (විදේශ) (සාමාන්‍ය වාණිජ කොට්ඨාශය හෝ ලඝු ලේඛක ටයිප් ගසන්නන්ගේ කොට්ඨාශය) හෝ උසස් වාණිජ අධ්‍යාපන සහතික පත්‍රය (විදේශ) (සාමාන්‍ය වාණිජ කොඨාශය හෝ ලඝු ලේඛක ටයිප් ගසන්නන්ගේ කොඨාශය) ; හෝ

(ඊ) ලංකා වාණිජ මණ්ඩලය (Ceylon Chamber of Commerce) සහ ලංකා අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ප්‍රදානය කරන ලද වාණිජ අධ්‍යයන සහතික පත්‍රය (සාමාන්‍ය වාණිජ කොට්ඨාශය හෝ ලඝු ලේඛක ටයිප් ගසන්නන්ගේ කොට්ඨාශය) හෝ උසස් වාණිජ අධ්‍යයන සහතික පත්‍රය (සාමාන්‍ය වාණිජ කොට්ඨාශය හෝ ලඝු ලේඛක ටයිප් ගසන්නන්ගේ කොඨාශය) ;

(උ) ලංකා කාර්මික විද්‍යාලයේ (ගණන් තබන්නන් සඳහා වූ හෝ ලඝු ලේඛක ටයිප් ගසන්නන් සඳහා වූ) වාණිජ සහතික පත්‍රය හෝ උසස් වාණිජ සහතික පත්‍රය.

**සැලකිය යුතුයි.**—මේ විභාගයට අයැදුම් පත් භාර ගැනීමේ අවසාන දිනයට පළමුව ප්‍රතිඵල පිට නොවී ඇති ඉහත කී කවර විභාගයකට හෝ පෙනී සිටි අපේක්ෂකයන්ගේ අයැදුම් පත් භාරගනු නොලැබේ.

(iv) 1959 මාර්තු 1 වන දින වන විට අපේක්ෂකයන්ගේ වයස අවුරුදු 17ට නො අඩුවත් අවුරුදු 26ට නො වැඩිවත් පැවතිය යුතු ය.

5. **යෝග්‍යතාව.—ලංකාවේ පිහිටි එක්සත් රාජ්‍යයට අයත් සේවාවන්හි නියුක්ත වූ එහෙත් හේවා වසමට අයත් නොවන සේවකයන්ට හා යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූවන්ට ද දෙනු ලබන විශේෂ අනුග්‍රහ.**

(i) එක්සත් රාජ්‍යයට අයත් සේවාවන්හි යෙදී සිට 1956 ජූලි මස 6 වැනි දින හෝ ඉන්පසුව හෝ සේවයෙන් ඉවත් කරනු ලැබූ හේවා වසමට අයත් නොවන ලාංකික සේවකයන් හෝ යුද කඳවුරු ආපසු ගැනීමට ආණ්ඩුව විසින් කරන ලද තීරණය නිසා සේවයෙන් ඉවත් කරනු ලැබීමට භාජනව සිටින අයද, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පිහිටි පෙරිය කරච්චියට නාරාහේන්පිට පිහිටි රාජකීය නාවික ගුවන් විදුලි මධ්‍යස්ථානය (ඇන්ඩර්සන් ගුවන් විදුලි මධ්‍යස්ථානය) ගෙනයාමට ආණ්ඩුව මගින් කරන ලද තීරණය හේතුකොටගෙන, 1954 සැප්තැම්බර් මස 27 වැනි දිනට පසුව සේවයෙන් ඉවත් කරන ලද අය ද, පහත දැක්වෙන අනුග්‍රහ ලැබීමට සුදුස්සෝ වෙති :—

(අ) මෙම ගණයට අයත් අපේක්ෂකයන්ට මෙහි 4 වැනි ඡේදයෙහි (iv) කොටසෙහි නියමිතව ඇති වයස් සීමාව ගණන් ගැනීමේ දී තමන් එක්සත් රාජධානියට අයත් සේවාවන්හි සේවය කළ කාල සීමාව තම වයසින් අඩු කිරීමට ඉඩ දෙනු ලැබේ. එහෙත් එසේ කිරීමට ඉඩ දෙනු ලබන්නේ ඔවුන්ගේ එම සේවා කාලය අඛණ්ඩව ද, සතුටුදායකව ද පැවතියේ නම් පමණකි.

(ආ) 1959 පෙබරවාරි මස 10 වැනි දිනට හෝ ඉන් පෙර හෝ එක්සත් රාජ්‍යයේ සේවාවන් යටතේ යටත් පිරිසෙයින් සිව් අවුරුද්දක සතුටුදායක අඛණ්ඩ සේවයක් සපුරා සිටි එහෙත් 4 වැනි ඡේදයෙහි (iii) කොටසෙහි දක්වන ලද අධ්‍යාපන සුදුසුකම් නොමැති අයට ඉදින් තමන් 7 (iii) ඡේදයෙහි (ආ) (i) කොටස යටතේ සඳහන් වුණු විභාග වලින් යටත් පිරිසෙයින් එකකින්වත් සාමර්ථ්‍යය ලබා ඇතොත්, මෙම පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩදෙනු ලැබේ.

(ii) යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූ අය පහත දැක්වෙන අනුග්‍රහ ලැබීමට සුදුස්සෝ වෙති :—

(අ) මෙහි 4 වැනි ඡේදයෙහි (iv) කොටසෙහි දක්වන ලද වයස් සීමාව ගණන් ගැනීමේ දී, අවඥා සහගත ලෙස සේවයෙන් නෙරපන ලද හෝ සේවයෙන් පහකරන ලද හෝ අවඥා සහගත ලෙස සේවයෙන් නිදහස් කරන ලද හෝ කිසියම් දුරාචාරී බවක් නිසා සේවයෙන් අස්වීමට සිදුවූ හෝ තැනැත්තන් හැර සේවා මුක්ත වූ අන්‍යයන්ට හෙවත් උප සේවකයන්ට හෝ නිලධරයන්ට හෝ හේවායන්ට හෝ තමන් ස්ථිර හමුදාවේ සේවය කළ කාල සීමාව තම වයසින් අඩු කිරීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) අවුරුදු හතරකට නො අඩු කාලයක් නිත්‍ය හට හමුදාවේ යෙදී සිටි එහෙත් මෙහි 4 වැනි ඡේදයෙහි (iii) කොටසෙහි දක්වන ලද අධ්‍යාපන සුදුසුකම් නොමැති අයට ඉදින් තමන් 7 (iii) ඡේදයෙහි (ආ) (i) කොටස යටතේ සඳහන් කරන ලද විභාගයන් අතුරෙන් යටත් පිරිසෙයින් එකකින්වත් සාමර්ථ්‍යය ලබා ඇතොත් මෙම පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

6. **සේවක සංඛ්‍යාව අඩු කිරීම සඳහා අස්කරනු ලැබූ ආණ්ඩුවේ සේවකයන්ට දෙන විශේෂ අනුග්‍රහ.**

ස්ථිර වූ හෝ තාවකාලික වූ හෝ නිලියක යෙදී ආණ්ඩුවේ සේවය කළ, එහෙත් සවකීය වැඩ හෝ හැසිරීම අසතුටුදායක වීම නිසා නොව, අන්‍ය වූ හේතුන් නිසා සේවය නවතා ලීමට භාජන වූ අය පහත දැක්වෙන අනුග්‍රහය ලැබීමට සුදුස්සෝ වෙති.

4 වැනි ඡේදයෙහි (iv) කොටසෙහි දැක්වුණු වයස් සීමාව ගණන් බැලීමේ දී සේවයෙන් පහකරනු ලැබීමෙන් හෝ වැඩ අසතුටුදායක වීමේ හේතුවෙන් හෝ ඉල්ලා අස්වීම නිසා හෝ ආණ්ඩුවේ සේවයෙන් අස්වුණු අය හැර අන්‍යයන්ට තමන් ආණ්ඩුව යටතේ සේවයෙහි යෙදී සිටි කාල සීමාව තම වයසින් අඩු කර ගැනීමට අවසර දෙනු ලැබේ.

* ආණ්ඩුවේ සේවයට බඳවා ගැනීමේ සියළු අවස්ථාවන් සඳහා "ලාංකික" යන වචනය විග්‍රහ කරනුයේ උප්පත්තියෙන් හෝ ලියාපදිංචි වීමෙන් හෝ ලංකාවේ පුරවැසි වූවන් වශයෙනි.

7. **යෝග්‍යතාව : ආණ්ඩුවේ සේවකයන්ට විශේෂ අනුග්‍රහ**—

(i) **අධි ලිපිකාර සේවයේ ලිපිකරුවෝ.**—1959 පෙබරවාරි 10 වැනි දින හෝ ඊට ප්‍රථමයෙන් ස්ථිර කරන ලද පත්වීම් ඇත්තාවූ ද, 1959 මාර්තු 1 වැනි දිනට අවුරුදු 45ට නොවැඩි වූ ද අර්ධ ලිපිකාර සේවයේ ලිපිකරුවන්ට අධ්‍යාපන සුදුසුකම් ගැන සැලකීමක් නැතිව මේ විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

**සංලක්ෂ්‍යය.**—මෙම විභාගයෙන් සාමර්ථ්‍යය ලබන ඉහත සඳහන් වර්ගයට අයත් වන, 1956 සැප්තැම්බර් 24 වැනි දිනට පළමුව පත් කරන ලද නිලධාරීන්, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා "ආදි ප්‍රවේශකයන්" වශයෙන් සලකනු ලැබේ.

(ii) **දිස්ත්‍රික්ක ලිපිකරුවෝ, පිටපත් කරන්නෝ සහ ටයිප් ගසන ලිපිකරුවෝ.** භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් තැනගේ පාලනය යටතේ පවත්නා ආණ්ඩුවේ දිස්ත්‍රික්ක ලිපිකාර සේවයේ නියුක්ත 1959 පෙබරවාරි 10 වැනි දින හෝ ඊට ප්‍රථම සවකීය දිස්ත්‍රික්ක ලිපිකාර පදවි ස්ථිර කරනු ලැබ සිටින ලිපිකරුවන්ටද, 1959 පෙබරවාරි 10 වැනි දිනට දවුරුද්දකට නො අඩු ස්ථිර සේවයක් ඇති පිටපත් කරන්නන්ට සහ ටයිප් ගසන ලිපිකරුවන්ට ද 1959, මාර්තු 1 වැනි දිනට ඔවුන්ගේ වයස අවුරුදු 45ට නොවැඩි නම්, අධ්‍යාපන සුදුසුකම් ගැන සැලකීමක් නැතිව මේ විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

**සංලක්ෂ්‍යය.**—මෙම විභාගයෙන් සාමර්ථ්‍යය ලබන, ඉහත දැක්වුණු වර්ගවලට අයත් වන, 1956 සැප්තැම්බර් 24 වැනි දිනට පළමුව පත් කරන ලද නිලධාරීන්, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා "ආදි ප්‍රවේශකයන්" වශයෙන් සලකනු ලැබේ.

(iii) **ස්ථිර සේවකයෝ.**—ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරන එහෙත් 7 වැනි ඡේදයේ (i) වැනි හා (ii) වැනි කොටස් යටතේ දෙනු ලබන අනුග්‍රහයනට සුදුසුකම් ලබා නොමැති පහත සඳහන් (අ) සහ (ආ) වර්ගවලට අයත් අයහට මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ :—

(අ) 1959 ජනවාරි මස 20 වැනි දිනට සේවයෙහි යෙදී සිටින පහත සඳහන් සුදුසුකම්වලින් යුක්ත අය :—

(i) ඔවුන් විසින් 4 වැනි ඡේදයේ (iii) කොටසෙහි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් ලබා තිබිය යුතුය.

(ii) 1959 මාර්තු 1 වැනි දිනට වයස අවුරුදු 45ට නො වැඩි විය යුතු ය.

(iii) ටයිප් ගසන්නන්ගේ සේවයට පත් කිරීමට තෝරාගනු ලැබුව හොත්, එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් සවකීය දෙපාර්තමේන්තුවලින් ඔවුන් මුදාහැරීමට කැමති විය යුතු ය.

(ආ) 1959 පෙබරවාරි 10 වැනි දිනට අනන්තර පූර්වයෙන් ආණ්ඩුව යටතේ යටත් පිරිසෙයින් අවුරුදු හතරක අඛණ්ඩිත සේවයක් සපුරා සිටින පහත සඳහන් සුදුසුකම්වලින් යුක්ත අය :—

(i) ඔවුන් පහත දක්වා ඇති විභාගවලින් යටත් පිරිසෙයින් එකකින් සාමර්ථ්‍යය ලබා සිටිය යුතු ය :—

(අ) කේම්බ්‍රිජ් ජූනියර් සහතිකය ;

(ආ) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාඨශාලා කනිෂ්ඨ සහතිකය ;

(ඇ) අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් අනුමත කරන ලද පාසැලකින් දෙන ලද පාඨශාලා කණිෂ්ඨ සහතිකය.

(ii) 1959 මාර්තු 1 වැනි දිනට වයස අවුරුදු 45ට නො වැඩි විය යුතු ය.

(iii) ටයිප් ගසන්නන්ගේ සේවයට පත් කිරීමට තෝරාගනු ලැබුව හොත්, එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් සවකීය දෙපාර්තමේන්තු වලින් ඔවුන් මුදා හැරීමට කැමති විය යුතු ය.

**සංලක්ෂ්‍යය.**—(අ) මෙම විභාගයෙන් සාමාර්ථ්‍යය ලබන ඉහත දැක්වුණු (අ) සහ (ආ) වර්ගවලට අයත් වන, 1956 සැප්තැම්බර් 24 වැනි දිනට පළමුව පත් කරන ලද නිලධාරීන්, රජයේ භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා "ආදී ප්‍රවේශකයන්" වශයෙන් සලකනු ලැබේ.

(ආ) 7 වැනි ඡේදයේ (iii) (අ) සහ (ආ) කොටස් යටතේ දුම්රිය, තැපැල්, මිනුම්දෝරු, ආරොග්‍යශාලා හා රේගු වැනි දෙපාර්තමේන්තු ගත ලිපිකාර සේවාවන්ට අයත් නිලධාරීන්ට මෙම විභාගයට පෙනී සිටීමට නො හැකි වේ. එසේ වුව ද, දැනට නිලධාරීන් බඳවා ගැනීම නවතා ඇති දෙපාර්තමේන්තු ගත ලිපිකරු සේවාවන්හි නියුක්තව සිටින ලිපිකරුවන්ට මෙම විභාගයට පෙනී සිටීමට අවසර තිබේ.

(iv) **තාවකාලික සේවකයෝ.**—ආණ්ඩුවේ සේවයෙහි තාවකාලික තනතුරු දරන පහත සඳහන් (අ) සහ (ආ) වර්ගවලට අයත් අයහට මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ :—

(අ) 1959 පෙබරවාරි 10 වැනි දිනට අනන්තර පූර්වයෙන් ආණ්ඩුව යටතේ යටත් පිරිසෙයින් අවුරුද්දක අඛණ්ඩිත සේවයක් සපුරා සිටින පහත සඳහන් සුදුසුකම් වලින් යුක්ත අය :—

(i) ඔවුන් විසින් 4 වැනි ඡේදයේ (iii) වැනි කොටසෙහි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් ලබා තිබිය යුතුයි.

(ii) 1959 මාර්තු 1 වැනි දිනට වයස අවුරුදු 45ට නො වැඩි විය යුතුයි.

(ආ) 1959 පෙබරවාරි 10 වැනි දිනට අනන්තර පූර්වයෙන් ආණ්ඩුව යටතේ යටත් පිරිසෙයින් අවුරුදු 4ක අඛණ්ඩිත සේවයක් සපුරා සිටින පහත සඳහන් සුදුසුකම්වලින් යුක්ත අය :—

(i) ඔවුන් විසින් 7 (iii) වැනි ඡේදයේ (ආ) (ii) කොටසෙහි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් ලබා තිබිය යුතුය.

(ii) 1959 මාර්තු 1 වැනි දිනට වයස අවුරුදු 45 ට නො වැඩි විය යුතුයි.

8. **අයදුම්පත්.**—(i) 1959 ජනවාරි 26 වැනි දින සිට පෙබරවාරි 10 වැනි දින දක්වා කාල සීමාව තුළ විභාග දෙපාර්මේන්තුවේ විමසීම් කාර්යාලයට පෞද්ගලික වශයෙන් පැමිණ හෝ "විභාග කොමසාරිස් තැන, මැලේ වීදිය, කොම්පඤ්ඤ වීදිය, තැපැල් පෙට්ටිය 1503, කොළඹ 2" යන ලිපිනයට ලියා තැපැල් මගින් ඉල්ලුම් කිරීමෙන් හෝ විභාගයට පෙනී සිටීම සඳහා ඇතුළත්වීමේ පෝර්ම ලබා ගත හැක. එක් විභාගාපෙක්ෂකයකුට දෙනු ලබන්නේ එක් පෝර්මයක් පමණකි.

මෙම විභාගය සඳහා ඇතුළත් වීමේ පෝර්ම තැපැල් මගින් ඉල්ලුම් කරන සෑම අයකු විසින් ම තමන්ගේ ලිපිනය හා වම්පස උඩ කෙළවරේ මෙම විභාගයේ නම ද ලියන ලද, තැපැල් මුද්දර නො ඇල වූ දිග ලියුම් කවරයකුත් සමග එසේ ඉල්ලුම් කරන ලෙස උපදෙස් දෙනු ලැබේ. එසේ කිරීමෙන් විභාග දෙපාර්තමේන්තුවට එම පෝර්මය ඔහු වෙත හෝ ඇය වෙත කඩිනමින් එවීමට හැකි වනවා ඇත.

(ii) අයදුම්පත් 1959 පෙබරවාරි 12 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන්, කොළඹ 2, විභාග කොමසාරිස් තැනට ලැබෙන පරිදි රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි.

එම දිනට පසුව ලැබෙන කිසිම අයදුම් පතක් භාරගනු නො ලැබේ. කවරයේ වම්පස උඩ කෙළවරේ විභාගයේ නම පැහැදිලිව ලියා තිබිය යුතුයි.

(iii) නියමානුකූලව අවලංගු කළ රුපියල් 10ක මුද්දර අයදුම් පතෙහි අලවා තිබිය යුතුයි.

(iv) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල දැනට රක්ෂාවේ යෙදී සිටින අපේක්ෂකයින් විසින් එවනු ලබන අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුයි. 6 වැනි ඡේදය යටතේ සුදුසුකම් වලට හිමිකම් පාන අපේක්ෂකයන් විසින් සිය අයදුම් පත් එවිය යුත්තේ ඔවුන් අන්තිමට සේවය කළ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාගේ මාර්ගයෙනි. එසේ නොකරන ලද කිසියම් අයදුම්කරුවෙකු වෙතොත් ඔහු විභාගයට නුසුදුස්සෙකු කොට සලකනු ලැබේ. 1959 පෙබරවාරි 12 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් විභාග කොමසාරිස් තැනට ලැබෙන පරිදි යවන්නට කියන ඉල්ලීම කුත් සමග සවකීය අයදුම්පත් තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් වෙත කල් ඇතිව ඉදිරිපත් කරන මෙන් අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ.

9. **විභාගයට ඇතුළත් කර ගැනීම.**—(i) ලැබී ඇති ඉල්ලුම් පත්‍ර සම්බන්ධයෙන් ඒ ඒ අපේක්ෂකයන් වෙත විභාග කොමසාරිස් වරයා විසින් ඇතුළත් වීමේ පෝර්ම කොළ නිකුත් කරනවා ඇත. විභාගයට පෙනී සිටින ඉල්ලුම්කරුවන් විසින් සවකීය ඇතුළත් වීමේ පෝර්ම කොළ විභාග ස්ථානය භාර නිලධාරි තැන වෙත ඉදිරිපත් කළ යුතු වේ. එවැනි පෝර්ම කොළයක් ඉදිරිපත් නො කරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

ඉල්ලුම්කරුවෝ, තම තමන් සඳහා නියම කර තිබෙන විභාග ශාලාවලට ඇතුල් වී විභාගයට පෙනී සිටිය යුත්තාහුය. යම්කිසි ඉල්ලුම්කරුවකු තමාට නියමිත විභාග ශාලාවෙන් පිටස්තර අන්‍ය ශාලාවකට ඇතුල් වුවහොත් ඔහුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නො ලැබේ.

ඇතුළත් වීමේ පෝර්මය සමග කාල සටහන් පිටපතක් ද අපේක්ෂකයින් විසින් පිළිපැදිය යුතු රෙකුලාසි ද අපේක්ෂකයින් වෙත යවනු ලැබේ. අපේක්ෂකයින් මේ රෙකුලාසිවලට යටත් විය යුතුයි. විභාගයට පෙනී සිටින්නා වූ සෑම අපේක්ෂකයකු විසින් ම විභාගය පවත්වන දිනයෙහි සවකීය ඇතුළත් වීමේ පෝර්මය පරීක්ෂක නිලධාරි තැනට භාරදිය යුතුයි.

යම්කිසි ඉල්ලුම්කරුවකුට විභාගයට කලින්—යටත් පිරිසෙයින් සත් දවසකට කලින්—තමාගේ ඇතුල් වීමේ පෝර්මය නො ලැබුණොත් ඔහු විසින් ඒ බව වහාම—

"විභාග කොමසාරිස් තැන,
මැලේ වීදිය, කොම්පොඤ්ඤ වීදිය,
තැපැල් පෙට්ටිය, 1503,
කොළඹ 2."

යන ලිපිනයට දැනුම් දිය යුතුයි. (විදුලි පණිවුඩ යවන ලිපිනය: "ඇක්සැමිස්", කොළඹ කියා වේ.) ඇතුළත් වීමේ පෝර්මය තමාට

(ii) එසේ කළ නො හැකි අපෙක්‍ෂකයන්ට තම තමන් අතරේ එක ටයිප් ගසන යන්ත්‍රයක් පාවිච්චි කිරීමට පිළියෙළ කර ගැනීමට ඉඩ දෙනු ලැබේ. එක් දිනක දී එක ටයිප් ගසන යන්ත්‍රයක් ප්‍රයෝජනයට ගැනීම සඳහා පිළියෙළ කරගන්නා අපෙක්‍ෂකයන්ගේ ගණන හතරකට වැඩි විය යුතු නො වේ. එසේ කරන අපෙක්‍ෂකයන් ඔවුන් අතුරෙන් පළමුවෙන් ටයිප් ගැසීමේ පරීක්‍ෂණය සඳහා පෙනී සිටිය යුතු අපෙක්‍ෂකයාට නියම දිනයෙහි දී විභාගය පටන් ගැනීමට ප්‍රථම විභාග මධ්‍යස්ථානය භාර නිළධාරී තැන වෙත ගොස් දැනුම් දිය යුතුයි. එක් එක් අපෙක්‍ෂකයාට නියම වී ඇති දිනය නොතකා එම අපෙක්‍ෂකයන් සියල්ලම එක දිනයෙහි ම විභාග මධ්‍යස්ථානය භාර නිළධාරී තැන පරීක්‍ෂනය කරනවා ඇත. ඒ සම්බන්ධව යොදා ගෙන ඇති වැඩ පිළිවෙළ පිළිබඳව අපෙක්‍ෂකයන් විසින් අන් දන්වීමක් දීම වුවමනා නො වේ.

(iii) තමන්ගේ ම ටයිප් ගසන යන්ත්‍ර ගෙන ඒමට නො හැකි හෝ අනිකුත් අපෙක්‍ෂකයන් සමග ඉහත දක්වුන පරිදි පිළිවෙලක් යොදා ගැනීමට නො හැකි හෝ අපෙක්‍ෂකයන් ඒ බව අඩුම ගණනේ විභාගය පටන් ගන්නා පළමු දිනට සති දෙකකට කලින් විභාග කොමසාරිස් තැන වෙත රෙජිස්ටර් තැපැලෙන් දන්විය යුතු ය. එසේ දන්වන අපෙක්‍ෂකයන් සඳහා විශෙෂ විධිවිධාන යොදනු ලැබේ. එහෙත් දෙනු ලබන ටයිප් ගසන යන්ත්‍ර වර්ගය කුමක් වුවත් ඒවායින් ටයිප් ගැසිය යුතු වේ.

(iv) ටයිප් ගසන ලද පත්‍රිකා හරි වැරදි බැලීමේ දී නිසි ශොභා පිළිවෙල, නිරවද්‍යතාව සහ වේගය ගණින් ගනු ලැබේ.

| | ලකුණු |
|---|---|
| (3) සාමාන්‍ය දැනීම—මිනිත්තු 30 යි | 50 |

**(ආ) වෛකල්පික විෂයය:**

| | |
|---|---|
| (4) සිංහල ලඝු ලේඛනය (මිනිත්තුවකට වචන 50 බැගින්) | 50 |

**සැළකිය යුතුයි.**—මේ විෂයය ගැනීමෙන් ලබන ලකුණුවලින් වාසියක් නො වන නිසා විභාගාපෙක්‍ෂකයන්ට මේ විෂයය ගැනීම හෝ නො ගැනීම කළ හැක. එහෙත් ලඝු ලේඛනය දන්නා විභාගාපෙක්‍ෂකයන් මේ විෂයය ගන්නා ලෙස උපදෙස් දෙනු ලැබේ.

## II වැනි කොටස

| | ලකුණු |
|---|---|
| සම්මුඛ පරීක්‍ෂණය | 50 |

පළමුවෙන් පවත්වනු ලබන්නේ ලිඛිත පරීක්‍ෂණ යයි. එහි ප්‍රතිඵල අනුව අපෙක්‍ෂකයන් සම්මුඛ පරීක්‍ෂණය සඳහා තරඟ ක්‍රමයට තෝරා ගන්නවා ඇත. කොළඹ පවත්වනු ලබන මේ සම්මුඛ පරීක්‍ෂණයේ දිනය ඔවුන්ට කල් තියා දැනුම් දෙනවා ඇත. සම්මුඛ පරීක්‍ෂණයට කැඳවිය යුතු ගණන නියම කරනු ලබන්නේ විභාග කොමසාරිස් තැනගේ ද අදහස් විමසා ක්‍රියා කරන භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් තැන විසිනි. සම්මුඛ පරීක්‍ෂණය සඳහා සුදුසුකම් දක්වන අපෙක්‍ෂකයන්ගේ ගණන රක්‍ෂා සඳහා ඇති පුරප්පාඩු ගණනට වඩා අඩු වුවහොත් සම්මුඛ පරීක්‍ෂණය නො පැවැත්වීමට ඉඩ තිබේ.

16. **ප්‍රතිඵල ප්‍රසිඞ කිරීම සහ පත්වීම් දීම.**—සමර්ථ වන අපෙක්‍ෂකයන්ගේ නම් ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කර සුදුසු පුරප්පාඩු ඇති වූ විට ඔවුන්ට පත්වීම් දෙනවා ඇත.

17. **වෛද්‍ය පරීක්‍ෂණය.**—තෝරා ගනු ලබන අපෙක්‍ෂකයන් විසින් ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු ශාරීරික තත්ත්වයක් ඇද්දැයි සෙවීමේ වෛද්‍ය පරීක්‍ෂණයකින් ද සාමර්ථ්‍යය ලැබිය යුතුයි.

18. මේ ව්‍යවස්ථාවලින් කිය වී නැති යම් කරුණක් වුවහොත් ඒ ගැන භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් තැනට සුදුසු යයි වැටහෙන අන්දමකින් ක්‍රියා කරනවා ඇත.

එච්. ඊ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

1959 ජනවාරි මස 20 වැනි දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේ දීය.

---

භාණ්ඩාගාරයේ අංකය : 1/60/5 (ජී).

## ටයිප් ගසන්නන්ගේ සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගය—මාර්තු, 1958

1958 මාර්තු 15 වැනි දින පවත්වන්නට යෙදුන ටයිප් ගසන්නන්ගේ සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගයේ ප්‍රතිඵල අනුව පහත නම් සඳහන් අපෙක්‍ෂක අපෙක්‍ෂිකාවන් ටයිප් ගසන්නන්ගේ සේවයට පත් කර ගැනීමට තෝරා ගනු ලැබූ බව මෙයින් දැනුම් දෙමි :—

| නම | ලිපිනය |
|---|---|
| ඉන්ද්‍රවංශ, කේ. ඩබ්ලිව්. ඒ. ... | 15, පන්සලහේන පාර, වැල්ලම්පිටිය. |
| කමලාවතී, එස්. ඩී. (මෙනෙවිය) | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, රිඩ් මාවත, කොළඹ 7. |
| කර්ලැයින්, එම්. ඩී. (මෙනෙවිය) | පෝස්ට්මාස්ටර් ජනරාල් කාර්යාලය, ප්‍රධාන තැපැල් කාර්යාලය, කොළඹ 1. |
| කරුණාරත්න, එච්. ඩී. එල්. ... | "මිනිලා", වැල්මිල්ල, බණ්ඩාරගම. |
| කරුණාවතී, පී. ටී. (මෙනෙවිය) | "පියසිරි", කම්මල්ගොඩ, ගෝනාපිනුවල. |
| කිරිමුදියන්සේ, ආර්. එම්. ... | පොලිස් ස්ථානය, හොරණ. |
| ගණේපොල, ජී. ඒ. බී. ... | සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, වරව් පාර, කොළඹ 7. |
| ගුණරත්න, පී. ආර්. ... | රත්න විද්‍යාලය, මාවතැල්ල. |
| ජයතිලක, ඩී. ජී. (මෙනෙවිය) | "ලිලී විලා", 134, ලෝරිස් පාර, කොළඹ 4. |
| ජයතිලක, වයි. සී. පී. ... | පොකුණුවිට. |
| ජයවික්‍රම, බී. ... | 9/2, මාදින්නාගොඩ, රාජගිරිය. |
| ජයසිංහ, ඊ. පී. ... | එච්. පී. සිරිවර්ධන මහතා බාරේ, 12, චැපල් පාර, නුගේගොඩ. |
| ජයසූරිය, එල්. පී. එස්. (මෙනෙවිය) | 873, රෙක්ස් මාර්ක් පාර, නාවින්න, නුගේගොඩ. |
| ජයසේන, ජේ. ඒ. ... | කහටපිටිය, කනන්විල, හොරණ. |
| ජිනදාස, පී. සී. ... | ගුංගමුව, බණ්ඩාරගම. |
| ජෝන් සිංඤෝ, වයි. ඩී. ... | කොස්කොටුව, මිල්ලැව, හොරණ |
| ටිකිරි බණ්ඩා, එච්. එම්. ... | "සඳ මැඳුර", නවගමුව, දේවාලේගම. |
| පියරත්න, ජී. එම්. එස්. ... | ඕ. පී. ඩී.—ඒ. ආර්. වී. ක්ලිනික්, මහාරෝගාශාලාව, කොළඹ. |
| පියසීලි, ඩබ්ලිව්. (මෙනෙවිය) ... | 939, අලුත් මාවත පාර, මෝදර. |
| පියසේන, ජී. එල්. ... | මුදල් අමාත්‍යංශය, මහ ලේකම් කාර්යාලය, කොළඹ 1. |
| පීරිස්, එච්. ජේ. සී. (මෙනෙවිය) | "ගුණ ජීන" නිවස; කෙසෙල් වත්ත, පානදුර. |
| පීරිස්, ඒ. වී. | ජේසෝනෝ හවුස් විද්‍යාලය, 932, 3 වැනි මරදාන, කොළඹ. |
| පීරිස්, බී. පී. (මෙනෙවිය) ... | කළුවැඩමුල්ල, අම්බලන්ගොඩ. |
| පෙරේරා, එල්. එස්. ... | 573, පතිරගොඩ පාර, නාවින්න, නුගේගොඩ. |
| ප්‍රනාන්දු, එම්. ඒ. ඊ. (මෙනෙවිය) | 185, තලාහේන, මීගමුව. |
| ප්‍රනාන්දු, එම්. ඩබ්ලිව්. එන්. | ධාවන පිළිබඳ අංශය, ලංකා ගමනා ගමන මණ්ඩලය, කිරුල පාර, කොළඹ 5. |
| මයිකල්, ඊ. ඒ. ... | ඒ. අයි. පෙරේරා මහතා බාරේ, කොහිලවත්ත, වැල්ලම්පිටිය. |
| රත්නාවලී, කේ. (මෙනෙවිය) | පටබැඳිමුල්ල, අම්බලන්ගොඩ. |
| ලීලාරත්න, ඩී. ඇම්. ... | පළාත් පාලන කාර්යාලය, රත්නපුර. |
| වීරරත්න, ඩී. සී. යූ. (මෙනෙවිය) | ආහාර කොමසාරිස්ගේ කාර්යාලය, යුනියන් පෙදෙස, කොළඹ. |
| සිල්වා, යූ. ඕ. ... | ගාලු පාර; පොහොද්දරමුල්ල, වාද්දුව. |
| සුමණාවතී, බී. කේ. ටී. (මෙනෙවිය) | "සමන් පාය", බෝකුන්දර, පිළියන්දල. |

2. ඉහත නම් සඳහන් අපේක්ෂක අපේක්ෂිකාවන්ට පත්වීම් වහාම දීමට අණඩුව භාර ගන්නේ නැත. පිරිමි අපේක්‍ෂකයින් තුන් අවුරුදු අස්ථිර පත්වීම් ඇතිව ද, අපේක්ෂිකාවන් තුන් අවුරුදු පරීක්‍ෂණ කාල සීමාවක් සහිතව ද පත් කෙරෙනු ඇත. සියළු අපේක්‍ෂක අපේක්ෂිකාවන් විසින් ම ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු ශාරීරික තත්ත්වයක් ඇද්දැයි සෙවීමේ වෛද්‍ය පරීක්‍ෂණයකින් සාමර්ථ්‍ය ලැබිය යුතුයි. තව ද, ඔවුන් ටයිප් ගසන්නන්ගේ සේවය පිළිබඳ කොන්දේසිවලට ද යටත් වෙනවා ඇත.

එච්. ඊ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

1959 ජනවාරි මස 20 දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේ දී ය.

## රාජකීය විද්‍යාලයට ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීමේ අතිරේක විභාගය

පහත සඳහන් පංතිවලට ඇති පුරප්පාඩු පිරවීම සඳහා ඇතුළත් වීමේ අතිරේක විභාගයක් 1959 ජනවාරි 31 වෙනි සෙනසුරාදා පෙරවරු 9ට රාජකීය විද්‍යාලයේදී පවත්වනු ලැබේ :—

| | |
|---|---|
| සත්වෙනි ප්‍රමාණය : | දෙමළ මාධ්‍යය—පුරප්පාඩු 5 යි |
| අටවෙනි ප්‍රමාණය : | දෙමළ මාධ්‍යය—පුරප්පාඩු 1 යි |
| අටවෙනි ප්‍රමාණය : | සිංහල මාධ්‍යය—පුරප්පාඩු 1 යි |

2. අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් ඇත්තන් විය යුතුය :—

**සත්වෙනි ප්‍රමාණය :**—අයදුම්කරුවන් නියමිත මාධ්‍යයෙන් 1958 දී සවෙනි ප්‍රමාණය සම්පූර්ණකර 1959 ජනවාරි 1 වෙනි දිනට වයස අවුරුදු 11 මාස 6ටත් අවුරුදු 12 මාස 6ටත් අතර විය යුතුය.

**අටවෙනි ප්‍රමාණය :**—අයදුම්කරුවන් නියමිත මාධ්‍යයෙන් 1958 දී සත්වෙනි ප්‍රමාණය සම්පූර්ණකර 1959 ජනවාරි 1 වෙනි දිනට වයස අවුරුදු 12 මාස 6ටත්, අවුරුදු 13 මාස 6ටත් අතර විය යුතුය.

3. පූර්වෝක්ත විභාගයට ඉදිරිපත් වීමට කැමති සියලුම අයදුම්කරුවන් 1959 ජනවාරි 31 වෙනි සෙනසුරාදා පෙරවරු 8.30ට විද්‍යාලීය කාර්යාලයට, දැනට ඉගෙනුම ලබන පාසැලේ ප්‍රධානාචාර්යවරයාගෙන්, උපන් දිනය, දැනට ඉගෙනුම ලබන පංතිය, චරිතය හා හැසිරීම පිළිබඳ සහතිකයක් ද රැගෙන පැමිණිය යුතුය.

4. ඉල්ලුම් පත් විභාගය දවසේම සම්පූර්ණ කොට දිය හැකිය. පරීක්ෂණයෙන් සමත් වූ අයදුම්කරුවන්ට ලියමනකින් දන්වනු ලැබේ. අනිකුත් අයදුම්කරුවන්ට දැන්වීමක් කරනු නොලැබේ.

ඩබ්ලි කේ. ජී. ද සිල්වා,
විද්‍යාලයාධිපති.

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1) මෘදු වානේ කෝණ, චැනල්, ජොයිස්ට් බාල්ක සහ ටී-කුඤ්ඤ (Mild Steel Angles, Channels, Joists & Tees) සැපයීම සඳහා 1959 අප්‍රේල් 28 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර් කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ රුපියල් 100ක ටෙන්ඩර් තැන්පත් මුදලක් බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1959 අප්‍රේල් 27 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

විදේශීය ටෙන්ඩර් කරුවන් සඳහා විශේෂ ටෙන්ඩර් පෝර්ම කොළ සකස් කර තිබේ. රුපියල් 100ක ටෙන්ඩර් තැන්පත් මුදලක් බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට බලය ලත් නියෝජිතයින්ට පමණක් එකී පෝර්ම කොළ දෙනු ලැබේ. ටෙන්ඩර් කරුවන් විසින් තමන්ට වුවමනා කවර අන්දමේ ටෙන්ඩර් පෝර්ම කොළ දැයි සඳහන් කළ යුතුයි.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ඩූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරි.

1959 ජනවාරි 23 වැනි දින,
කොළඹදීය.

---

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### ජාත්‍යන්තර සහයෝගතා සංවිධානය (ICA)

අධ්‍යාපන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන් විසින් 1959 අප්‍රේල් 3 වෙනි දින පෙරවරු 10.30 දක්වා අධ්‍යාපන දෙපාර්තමේන්තුවට පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ :—

| ද්‍රව්‍ය | ටෙන්ඩර් අංකය |
|---|---|
| (1) ගබඩා කැබිනෙට්ටු (400) | ICA—211 |
| (2) උපකරණ පෙට්ටියක් (සම්පූර්ණ කට්ටල 400ක්) | ICA—212 |

කොළඹ, පාසන්ස් පාරේ රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ, අධිකාරි තැනගෙන් ටෙන්ඩර් පෝරම ලබා ගත හැක. ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට පෙර ටෙන්ඩර් කරුවන් විසින් තම තමන් වෙනුවෙන් බඩු සපයන, පිටරටවල ඇති ප්‍රධාන වෙළඳ ආයතනයන්ගේ නම් හා ලිපිනයන් ද සැපයිය යුතුයි.

වැඩි විස්තර රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ඇල්. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරි.

1959 ජනවාරි 20 වැනි දින,
කොළඹ.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

බටඅත ගොවි පලට ගඩොල් සැපයීම. හම්බන්තොට කෘෂිකර්ම කාර්යාලයේ පාලන නිලධාරි තැන විසින් බටඅත ගොවිපලට ගඩොල් 20,000 ක් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1959 පෙබරවාරි මස 20 වෙනි දින පස්වරු 2.30 වන තෙක් භාරගනු ලැබේ.

2. හම්බන්තොට කෘෂිකර්ම කාර්යාලයේ පාලන නිලධාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා සිල් තබා "පාලන නිලධාරි තැන, කෘෂිකර්ම කාර්යාලය, හම්බන්තොට" යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කොනෙහි "බටඅත ගොවිපලට ගඩොල් සැපයීමේ ටෙන්ඩර් පත්‍රය" යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් නොඑවතොත් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් හම්බන්තොට කෘෂිකර්ම කාර්යාලයේ පාලන නිලධාරි තැනට ඒවා අතින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහා ලන ලද කවරයෙහි "බට අත ගොවිපලට ගඩොල් සැපයීමේ ටෙන්ඩර් පත්‍රය" යන්න ලියා ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි.

4. රෙජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලු ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුලත යම් ටෙන්ඩර් කරුවකුට එවැනි දැන්වීමක් නොලැබුනොත් ඔහු හම්බන්තොට කෘෂිකර්ම කාර්යාලයේ පාලන නිලධාරි තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුය.

5. ටෙන්ඩර් කරුවන්ට උවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත යටකී දිනයේ යටකී වේලාවේ දී හම්බන්තොට කෘෂිකර්ම කාර්යාලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

6. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු **නොලැබේ.**

පත්කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා 10 දිනක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නො හැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්ට ඉඩ තිබේ.

7. නියමිත පෝර්මයේ ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

8. ටෙන්ඩර් කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

9. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද පිළිගනු ලැබුවාවූද දේවල මුළු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂක තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත් කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වවුනියා උතුර කොට්ඨාශය භාර ප්‍රාදේශික වාරි කර්මාන්ත ඉංජිනේරු තුමා විසින් මන්නාරම් උප කොට්ඨාශයට අයිති සිරාට්ටිකුලම් වැව අලුත් වැඩියා කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රු. 20,000කට හෝ ඊට වැඩියෙන් ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර 24.2.59 දින දක්වා භාරගනු ලැබේ.

වැඩි විස්තර සඳහා මන්නාරම් උප කොට්ඨාශය භාර ඉංජිනේරු තුමාගෙන් විමසන්න.

වාරිමාර්ග ඉංජිනේරු තුමා,
මන්නාරම් උප කොට්ඨාශය.

12.1.59
වාරිමාර්ග දෙපාර්තමේන්තුව.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වවුනියා උතුර කොට්ඨාශය භාර ප්‍රාදේශික වාරි කර්මාන්ත ඉංජිනේරු තුමා විසින් මන්නාරම් උප කොට්ඨාශයට අයිති සිරාට්ටිකුලම් වැව අලුත් වැඩියා කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රු. 50,000 කට හෝ ඊට වැඩියෙන් ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර 24.2.59 දින දක්වා භාරගනු ලැබේ.

වැඩි විස්තර සඳහා මන්නාරම් උප කොට්ඨාශය භාර ඉංජිනේරු තුමාගෙන් විමසන්න.

වාරිමාර්ග ඉංජිනේරුතුමා
මන්නාරම් උප කොට්ඨාශය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

ත්‍රිකුණාමල කොට්ඨාශයේ ප්‍රාදේශික වාරිමාර්ග ඉන්ජිනේරුතුමා ඕර්ස් හිල්, ත්‍රිකුණාමලය විසින් වෙන වෙනම අල්ලෙයි වාරිමාර්ග ව්‍යාපාරයේ කල්ලාර්හි වාරිමාර්ග ඉන්ජිනේරුතුමාගේ බංගලාව සහ කාර්මික සහ කරුවන්ගේ බංගලාවක් තැනීම සඳහා රුපියල් තිස්දහකට (රු. 30,000) සහ රුපියල් විසිපන්දහකට (රු. 25,000) හා ඊට වැඩියෙන් ලියාපදිංචි කරනලද මෙම දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර 10.2.59 දින පූ. භා. 9.30 තෙක් භාරගනු ලැබේ.

ටෙන්ඩර් ෆෝර්ම් කොළ හා අනිකුත් සියලු විස්තර අල්ලෙයි වාරිමාර්ග ව්‍යාපාරයේ කල්ලාර්, කිලිවෙඩ්ඩියි වාරිමාර්ග ඉන්ජිනේරුතුමාගෙන් 7.2.59 දින දහවල් 12 වනතෙක් ලබාගත හැක. ගොඩනැගිල්ලේ සැලැස්මද මෙහිදී බැලිය හැකිය.

ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙක බැගින් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර ලබාගැනීමට පෙර මෙම කාර්යාලයේ හෝ අන්‍ය කච්චේරියක රු. 50 සහ රු. 25 මුදලක් තැන්පත් කළ බවට සුදුසු කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුය. දැනට රජයේ වැඩ ලබා ඇති කොන්ත්‍රාත්කරුවන් තමාගේ වැඩ බලන නිලධාරියාගෙන් වැඩ සතුටුදායක බවට ලබාගත් සහතිකයක් ටෙන්ඩර් පත්‍රිකා සමග ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් කරුවන්ට උවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට ඉඩදෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘතකරනු ලබන්නේ ත්‍රිකුණාමලේ ප්‍රාදේශික වාරිමාර්ග ඉන්ජිනේරුතුමාගේ කාර්යාලයේ 10.2.59 දින පූ. භා. 10 ටය.

ආර්. ජී. සී. පී. විජයතිලක,
වාරිමාර්ග ඉන්ජිනේරුතුමා,
අල්ලෙයි වාරිමාර්ග දෙපාර්තමේන්තුව.

කිලිවෙඩ්ඩි,
15.1.59.

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### "ප්‍රිෆැබ්රිකේටඩ්" තහඩු ගසා තනන තාවකාලික ගොඩනැගිලි සැපයීම

පහත් සඳහන් "ප්‍රිෆැබ්රිකේටඩ්" තහඩු ගසා තනන තාවකාලික ගොඩනැගිලි සඳහා ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1959 මාර්තු මස 24 වෙනි අඟහරුවාදා පෙරවරු 10 තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ :—

(අ) අඩි 80×20 ලැගුම් නිවාස 15ක්; අඩි 6—0" ඉස්තෝප්පුව හා අඩි 20×10 කුස්සිය.

(ආ) පියෑදුරු නිවාස 6ක්, අඩි 12×10 කාමර 5ක්, අඩි 6 ඉස්තෝප්පුවක් ඉදිරිපසින් හා 4 ඉස්තෝප්පුවක් පසුපසින්, අඩි 12×16 කුස්සිය.

(ඉ) සමූපකාර ගබඩා ගොඩනැගිලි 6ක්, අඩි 14×12 කාමර දෙකක්, අඩි 7 ඉස්තෝප්පුවක් ඉදිරිපසින් හා පසුපසින් 7'×10' කාමරයක්.

(ඊ) කියවීම් ශාලා 6ක්, අඩි 20×30 කාමරයක් සහිත අඩි 10×20 ගබඩාව.

(උ) කාර්යාලීය ගබඩා ගොඩනැගිලි 6ක්, අඩි 30×20 කාමර දෙකක් සහිත අඩි 6 ඉස්තෝප්පුවක්.

(ඌ) ලොරි සඳහා ගරාජ් 6ක්, අඩි 20×50 නොවැසුනු මඩුව.

(එ) සුළු සේවකයින්ගේ නිවාස 6ක්. අඩි 12—6"×අඩි 14 කාමරයක් සහිත අඩි 7×12 ඉස්තෝප්පුව, අඩි 7×12 කුස්සිය.

2. ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල වශයෙන් රු. 100/-ක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තුමාගේ කාර්යාලයට හෝ කොළඹින් බැහැර කච්චේරියකට බැඳ ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කර කොළඹ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තුමාගෙන් 1959 පෙබරවාරි මස 20 වැනි සිකුරාදට ප්‍රථම ලබාගත හැකි අයදුම් පත්‍රයක් සමග අනුපිටපතක් ද පුරවා ඉහත කී ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමාට ඉදිරිපත් කළ යුතුයි.

3. කොළඹ ගාලු මුවදොර මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ 355 දරණ කාමරයේදී 1959 මාර්තු මස 24 වැනි අඟහරුවාදා පස්වරු 2.30ට මෙම ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති නම් ටෙන්ඩර් කරුවන්ට එකී අවස්ථාවේදී පැමිණ සිටිය හැකිය.

4. වැඩි දුරටත් අවශ්‍ය කරුණු ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තුමාගෙන් ලබාගත හැකිය.

සී. ද ෆොන්සේකා,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
කොළඹ.
1959 ජනවාරි 6.

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය ව්‍යාපාරයේ ගොඩනැගිලි සෑදීම සඳහා බඩු බාහිරාදිය සැපයීම

පදවියේ ඉඩම් සංවර්ධන නිලධාරී තැන විසින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය ව්‍යාපාරය ගොඩනැගිලි සෑදීමට අවශ්‍ය පහත සඳහන් බඩු බාහිරාදිය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1959 පෙබරවාරි මස 20 වැනි දින පස්වරු 3 දක්වා බාර ගනු ලැබේ :—

(1) ගඩොල් "ප්‍රමාණය 8¾", 4¼", 2¾" විය යුතුයි".

(2) කළු ගල් "අඟල් 6—9 ප්‍රමාණය විය යුතුයි" කියුබ් ගණනින්.

(3) අළු හුනු "බුසල රු. 44 ට අඩු නොවිය යුතුයි."

(4) තම්බාපු හුනු බුසල් ගණනින්.

(5) පොල් අතු "ඉරු දෙක බැගින්, වියන ලද ඒවා" දිගින් අඩි 7ත් පළලින් අඩි 1 1/2 විය යුතුයි.

(6) කැපූ අමු පොල් අතු.

(7) කලුගල් 1", ¾", 2" කියුබ් ගණනින්.

1959 පෙබරවාරි 6 වැනි දින දවල් 12 දක්වා පදවිය ඉඩම් සංවර්ධන නිලධාරී තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි ෆෝර්ම් කොලවල ටෙන්ඩර පත්‍ර ලියා අනු පිටපතකුත් සහිතව ඉදිරිපත් කළ යුතුයි. ඉහත කී පදවියේ ඉඩම් සංවර්ධන නිලධාරී තැනගේ කාර්යාලයේ හෝ කච්චේරියක රුපියල් 50 ඇප මුදලක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කොට ටෙන්ඩර් පත්‍රිකා ලබා ගත යුතුයි.

1959 පෙබරවාරි 20 වැනි දින පස්වරු 3.30 ට ඉඩම් සංවර්ධන නිලධාරී තැනගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරනු ලැබේ. අවශ්‍ය නම් ටෙන්ඩර කරුවන්ට මේ අවස්ථාවේ දී පැමිණ සිටිය හැක.

මේ ගැන සම්පූර්ණ විස්තර පදවිය ඉඩම් සංවර්ධන නිලධාරී තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ජී. අමරසේන,
ඉඩම් සංවර්ධන නිලධාරී තැන.

1959 ජනවාරි 6 වැනි දින,
ඉඩම් සංවර්ධන කාර්යාලය,
පදවිය.

## ආහාර දෙපාර්තමේන්තුව

### හාල් විකිණීම

පහත සඳහන් හාල් විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1959 පෙබරවාරි 5 වෙනි දින පස්වරු 2.30 තෙක් භාරගනු ලැබේ:—

(අ) ස්පාඤ්ඤයේ සහ මිසරයේ හාල් ටොන් 800ක් පමණ,

(ආ) මදක් ගුල්ලන් විදින ලද හාල් ටොන් 300ක් පමණ.

මිලයට ගතහැක්කේ මෙරට ඉල්ලුම් කරුවන්ට පමණකි. මෙම හාල් මෙරටේ විකිණීමට පුද්ගලික වෙළඳුන්ට ඉඩ දෙන්නේ ඒ සඳහා විශේෂයෙන් ලියා පදිංචිවූ විටය. එහෙත් තෙමසක් තුළ හාල් විකිණිය යුතු වේ. ගැනුම් කරුවන්ට අවශ්‍ය නම් හාල් පිටරට යැවීම සඳහා බලපත්‍ර දෙනු ලැබේ.

දෙවර්ගයේම මුළු තොගය මිළයට ගැනීම සඳහා හෝ සැලකිය යුතු තොගයක් මිළයට ගැනීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් කරන මිලට අමතර වශයෙන් පැටවීමේ ගාස්තුව ලෙස මිටියකට ශත 6ක් අය කරනු ලැබේ. ටෙන්ඩරය පිළිගෙන සති දෙකක් ඇතුළත හාල් ඉවත් කරගත යුතු අතර ටෙන්ඩරය පිළිගෙන සතියක් ඇතුළත මුදල් තැන්පත් කළ යුතුයි.

දෙපාර්තමේන්තුවේ රුපියල් 100ක් තැන්පත් කොට ලබා ගන්නා ෆෝර්ම වල ටෙන්ඩර් පිළියෙල කළ යුතුයි. පිළිනොගත් ටෙන්ඩර් කරුවන්ගේ තැන්පත් මුදල් ආපසු දෙනු ලැබේ. වැඩි විස්තර මගෙන් ලබාගත හැකිය.

කේ. ඇම්. ඩී. ජයනෙත්ති,
ආහාර කොමසාරිස්.

1959 ජනවාරි 17 දින,
කොළඹදීය.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### පෙරදිග සංගීත භාණ්ඩ සැපයීම සඳහා ටැන්ඩර් පත්‍ර—1958-59

පෙරදිග සංගීත භාණ්ඩ සැපයීම සඳහා, 1959 පෙබරවාරි මස 13 වන සිකුරාදා පෙරවරු 10.30 වන තෙක් කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටැන්ඩර් පත්‍ර එවීමට බලාපොරොත්තු වන අය විසින් විස්තර ලේඛන ඉල්ලා සිටි විට, අධ්‍යාපනාධ්‍යක්ෂ වරයා වෙනුවෙන් කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ බඩුබාහිරා සැපයීමේ ශාඛාව විසින් ඒවා ඔවුනට නොමිලයේ සපයනවා ඇත.

3. භාණ්ඩ සියල්ලටම හෝ වර්ග කිහිපයකට හෝ එක් වර්ගයකට හෝ එක් වර්ගයකින් කොටසකට හෝ ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

4. කොළඹ ටැන්ඩර් කරු භවතුන් විසින් අධ්‍යාපනාධ්‍යක්ෂ තැන නමට කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඒ. සී. ශාඛාවෙහි ද කොළඹින් පිට අය විසින් කොළඹින් පිට කච්චේරියක ද රු. 100ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, 1959 පෙබරවාරි මස 12 වෙනි දින තෙක් සාමාන්‍ය රාජකාරි කාලය තුළදී ටැන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

එල්. ඞී. එස්. කරුණාරත්න,
අධ්‍යාපනාධ්‍යක්ෂ වෙනුවට.

1959 ජනවාරි මස 19 වන දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දීය.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1959 පෙබරවාරි මස 13 වන කිවි දින පෙරවරු 10.30 වන තෙක් පහත සඳහන් වන වැඩ සඳහා ටැන්ඩර් පත්‍ර කොළඹ 3, බ. ප. අධ්‍යාපන කායශීලයේ ටැන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ:—

| පාසැලේ නම | කළයුතු වැඩය |
|---|---|
| (1) කො/වෙදමුල්ල මි. පා. ... | ක්‍රීඩා භූමිය තැනීම. |
| (2) කො/වේයන්ගොඩ ජ්‍යෙෂ්ඨ පාසැල | ජල සම්පාදනය. |
| (3) කො/මහරගම අභ්‍යාස විද්‍යාලය | බාස්කට් බෝල් පිට්ටනිය තැනීම |
| (4) කො/එගොඩඋයන ජ්‍යෙෂ්ඨ පාසැල | පෝම්ප ඇන්ජින් කාමරය තැනීම. |
| (5) කො/මිහිඳුමාවත මි. ප. ... | තාප්පය රෙපයේරුව. |
| (6) ක/නැගින්න මි. ප. ... | පාසැල් ගොඩනැගිල්ල තැනීම. |
| (7) ක/යගිරල මි. ප. ... | එම |
| (8) ක/පත්තිල මි. පා. ... | එම |
| (9) ක/පූහාඹුගොඩ මි. පා. ... | රෙපයේරුව. |
| (10) ක/ එම ... | වැසිකිලි සහ කැසිකිළි තැනීම. |

සංලක්ෂ්‍යය : කො = කොළඹ දිස්ත්‍රික්කය.
ක = කළුතර දිස්ත්‍රික්කය.

2. අංක 1-10 යන වැඩවලට රු. 6,000 කට හෝ ඊට වැඩි ගණනකට ගොඩනැගිලි තැනීම සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ අංක 1-10 යන වැඩවලට රු. 12,000 ගොඩනැගිලි තැනීම සඳහා ප්‍රසිඩ වැඩ දෙපාර්තමේන්තුවේ ලියා පදිංචිව සිටින්නාවූද, අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයේ (ඒ. සී. ශාඛාවේ) හෝ කොළඹින් පිට කච්චේරියක හෝ රු. 100 මුදලක් තැන්පත්කොට ලබාගත් කුවිතාන්සියක් කොළඹ 3, බස්නාහිර පලාතේ අධ්‍යාපන නිලධාරි තැනට ඉදිරියත් කරන්නාවූද අයට, 1959-2-12 වන දින පස්වරු 3.30 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. චැක්පත්, මනිඕඩර, පෝස්ටල් ඕඩර යනාදිය භාරගනු නොලැබේ.

3. ටැන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන අවස්ථාවේදී දනට රජයේ යටතේ ඇති කොන්ත්‍රාත් සම්බන්ධව පහත සඳහන් පරිදි සහතිකයක් ටැන්ඩර්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුයි:—

| වැඩයේ නම | කොන්ත්‍රාත්තුවේ දිනය | කොන්ත්‍රාත්තුවේ මුලු ගණන | වැඩය අවසාන කිරීමට නියමිත දිනය (කල්දීම ඇතිව) | වැඩය සතුටු දයකද අසතුටුදයකද යන වග | දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය ප්‍රධානතැනගේ අත්සන |
|---|---|---|---|---|---|

ඉහත සඳහන් වන්නේ මවිසින්/අප විසින් කොන්ත්‍රාත් ගෙන තිබෙන සියලුම වැඩ වල සම්පූර්ණ විස්තරයක් බැව් සහතික කරමි/කරමු.

————————,
ටැන්ඩරකරුගේ අත්සන.

දිනය :————————.

4. ටැන්ඩර්කරුවන් විසින් පූර්වෝක්ත තුන්වන (3) ඡේදයේ අසා තිබෙන විස්තර පිළිබඳ සම්පූර්ණ සත්‍යය සඟවා ප්‍රකාශ කිරීම කොන්ත්‍රාත්තුවක් ඕනෑම අවස්ථාවක අවලංගු කිරීමට ප්‍රමාණවත් වන බැව් සැලකිය යුතුයි.

5. ටැන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් (එස්. ඩබ්ලිව්. ශාඛාවෙන්) හෝ බස්නාහිර පලාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගතයුතුය. මුදල් ගෙවීමේ පත්‍ර නිකුත් කරනු ලබන්නේ දෙවන ඡේදයේ සඳහන් වන මුදල් ප්‍රමාණයට ලියාපදිංචිව ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණකි.

6. පූර්වෝක්ත 2 වන ඡේදයේ සඳහන් වන පරිදි අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත් ටැන්ඩර් ෆෝර්ම එවිය යුත්තේ දෙවන පිටපතකුත් සමගය. සියලුම විස්තර හා තොරතුරු බස්නාහිර පලාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් දනගත හැකිය. සැලැස්ම එහිදී බලාගත හැකිය. තැපැලෙන් එවන ටැන්ඩර් පත්‍ර "ටැන්ඩර් සභාවේ සභාපති, බ. ප. අධ්‍යාපන කායශීලය, තර්ස්ටන් පාර, කොළඹ 3" යන ලිපිනයට රිජිස්ටර් තැපැලෙන් එවිය යුතුය. ප්‍රාදේශීය ටැන්ඩර්කරුවන් විසින් ටැන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපැලෙන් නොඑවන්නේ නම්, ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රා තබන ලද ටැන්ඩර් පත්‍ර බ. ප. අධ්‍යාපන කායශීලයේ කායශීල සහකාර නිලධාරි තැනට භාර දී, එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබාගතයුතුය. එසේ භාර දෙන ටැන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටැන්ඩර්කරුගේ නමද, ලිපිනයද වැඩයේ නමද ලියා තිබිය යුතුයි.

7. 1959 පෙබරවාරි මස 13 වන කිවි දින පෙරවරු 10.30ට කොළඹ 3, තර්ස්ටන් පාර බ. ප. අධ්‍යාපන කායශීලයේ දී ටැන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටැන්ඩර් විවෘත කරන විට ටැන්ඩර්කරුවන්ට විවෘත කරන ස්ථානයෙහි සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටැන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ගාස්තු ප්‍රමාණයද (රේට් ගණන් ද) ටැන්ඩර්කරුවන්ගේ නම් ද පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

8. ටැන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටැන්ඩර් පත්‍ර භාරගැනීම අවසාන කර සති 6කට නොඅඩු කාලයක් තුළ අවකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුය.

9. වෙනත් අවශ්‍ය විස්තර කොළඹ 3, බස්නාහිර පලාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත හැකි අතර ටැන්ඩර් ලියකියවිලි ද මෙහිදී පරීක්ෂාකර බැලිය හැකිය.

10. තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ පුහුණු හෝ වේවා නුපුහුණු හෝ වේවා ලාංකික කම්කරුවන් ය. ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම කම්කරුවන් හැකිතාක් දුරට බඳවා ගත යුතුය. සේවයේ යෙදියයුත්තේ ලාංකික කම්කරුවන් හා ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේම කම්කරුවන්ම පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුලත් කරනු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙහි නොවන කම්කරුවන් හෝ, සේවයේ යෙදීමට අධ්‍යාපනාමාත්‍යාංශයේ සථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපනාධ්‍යක්ෂවරයා විසින් අවසර දී ඇති විශෙෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහත කී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළ සේ සලකනු ලැබීමට ද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමට ද යටත් වේ. ලාංකික නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේ හෝ නොවන කම්කරුවන් ඉහත කී අනුමතිය හෝ සම්මුතිය ලබා නොගෙන සේවයේ යෙදීම තහනම්ය.

ඩබ්ලිව්. ඇම්. ඒ. වර්ණසූරිය,
බ. ප. අධ්‍යාපන නිලධාරි තැන.

1959 ජනවාරි මස 20 වැනි දින,
කොළඹ 3, බ. ප. අධ්‍යාපන කාර්යාලයේ දීය.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1959 පෙබරවාරි මස 13 වන කිවි දින පස්වරු 2.30 වන තෙක් පහත සඳහන් වන වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාසැලේ නම | කළයුතු වැඩය |
|---|---|
| (1) කො/ඉහළයාගොඩ ගැ. පා. ... | පාසැල් ගොඩනැගිල්ල, ගුරු නිවාසය සහ වැසිකිලි තැනීම. |
| (2) කො/ඇඹරළුව පි. පා. ... | පාසැල් ගොඩනැගිල්ල, ගුරු නිවාසය සහ වැසිකිලි තැනීම. |
| (3) ක/නාකලන්දගොඩ මි. පා. ... | පාසැල් ගොඩනැගිල්ල, ගුරු නිවාසය සහ වැසිකිලි තැනීම. |
| (4) ක/ලත්පඳුර මි. පා. ... | පාසල් ගොඩනැගිල්ල සහ වැසිකිලි තැනීම. |
| (5) ක/තොටහ මි. පා. ... | පාසැල් ගොඩනැගිල්ල, ළිඳ සහ වැසිකිලි තැනීම. |
| (6) ක/ඉලුක්පොත මි. පා. ... | පාසැල් ගොඩනැගිල්ල, ගුරු නිවාසය, ළිඳ සහ වැසිකිලි තැනීම. |
| (7) ක/මොල්කාව මි. පා. ... | පාසැල් ගොඩනැගිල්ල, ගුරු නිවාසය, ළිඳ සහ වැසිකිලි තැනීම. |

සංලක්ෂ්‍යය.—කො = කොළඹ දිස්ත්‍රික්කය.
ක = කළුතර දිස්ත්‍රික්කය.

2. අංක 1, 2, 3, 6, 7 යන වැඩවලට රු. 27,500 කට හෝ ඊට වැඩි ගණනකටද, අංක 5 යන වැඩවලට රු. 15,000කට හෝ ඊට වැඩි ගණනකටද, අංක 4 යන වැඩවලට රු. 12,500 කට හෝ ඊට වැඩි ගණනකටද ගොඩනැගිලි තැනීම් සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ අංක 1, 2, 3, 6, 7 යන වැඩවලට රු. 45,000 කට හෝ ඊට වැඩි ගණනකටද, අංක 5 යන වැඩවලට රු. 30,000 කට හෝ ඊට වැඩි ගණනකටද, අංක 4ට රු. 25,000 ට හෝ ඊට වැඩි ගණනකටද ගොඩනැගිලි තැනීම සඳහා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිව සිටින්නාවූද, අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගේ කායාලයේ (ඒ. සී. ශාඛාවේ) හෝ කොළඹින් පිට කච්චේරියක හෝ රු. 100. මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක්, කොළඹ 3, බස්නාහිර පළාතේ අධ්‍යාපන නිලධාරි තැනට ඉදිරිපත් කරන්නාවූද අයට, 1959.2.12 වන දින පස්වරු 3.30 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මනිඕඩර්, පෝස්ටල් ඕඩර යනාදිය භාර ගනු නොලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන අවස්ථාවේදී දැනට රජයේ යටතේ ඇති කොන්ත්‍රාත් සම්බන්ධව පහත සඳහන් පරිදි සහතිකයක් ටෙන්ඩර් කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුයි :—

වැඩයේ නම :————.

කොන්ත්‍රාත්තුවේ දිනය :————.

කොන්ත්‍රාත්තුවේ මුළුගණන :————.

වැඩය අවසාන කිරීමට නියමිත දිනය (කල් දීම් ඇතිව) :————.

වැඩය සතුටුදායකද අසතුටුදායකද යන වග :————.

දෙපාර්තමේන්තුවේ ප්‍රදේශීය ප්‍රධාන තැනගේ අත්සන :————.

ඉහත සඳහන් වන්නේ ම විසින්/අප විසින් කොන්ත්‍රාත් ගෙන තිබෙන සියලුම වැඩවල සම්පූර්ණ විස්තරයක් බැව් සහතික කරමි/කරමු.

————,
ටෙන්ඩර් කරුගේ අත්සන.

දිනය :————.

4. ටෙන්ඩර් කරුවන් විසින් පූර්වෝක්ත තුන්වන (3) ඡේදයේ අසා තිබෙන විස්තර පිළිබඳ සම්පූර්ණ සත්‍යය සඟවා ප්‍රකාශ කිරීම කොන්ත්‍රාත්තුවක් ඕනෑම අවස්ථාවක අවලංගු කිරීමට ප්‍රමාණවත් වන බැව් සැලකිය යුතුයි.

5. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් (එස්. ඩබ්ලිව්. ශාඛාවෙන්) හෝ බස්නාහිර පළාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත යුතුය. මුදල් ගෙවීමේ පත්‍ර නිකුත් කරනු ලබන්නේ දෙවන ඡේදයේ සඳහන් වන මුදල් ප්‍රමාණයට ලියාපදිංචිව ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණකි.

6. පූර්වෝක්ත 2 වන ඡේදයේ සඳහන් වන පරිදි අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත් ටෙන්ඩර් ෆෝර්ම එවිය යුත්තේ දෙවන පිටපතකුත් සමඟය. සියලුම විස්තර හා තොරතුරු බස්නාහිර පළාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් දැනගත හැකිය. සැලැස්ම එහිදී බලාගත හැකිය. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර "ටෙන්ඩර් සභාවේ සභාපති, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, මලයි වීදිය, කොළඹ 2" යන ලිපිනයට රිජිස්ටර් තැපැලෙන් එවිය යුතුය. ප්‍රාදේශීය ටෙන්ඩර් කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපැලෙන් නොඑවන්නේ නම්, ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කායාලය සහකාර නිලධාරි තැනට භාර දී, එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබාගත යුතුය. එසේ භාර දෙන ටෙන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටෙන්ඩර් කරුගේ නමද, ලිපිනයද වැඩයේ නමද ලියා තිබිය යුතුයි.

7. 1959 පෙබරවාරි මස 13 වන කිවි දින පස්වරු 2.30ට කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට විවෘත කරන ස්ථානයෙහි සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ගාස්තු ප්‍රමාණයද (රේට් ගණන්ද) ටෙන්ඩර් කරුවන්ගේ නම් ද පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

8. ටෙන්ඩර් කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසාන කර සති 6කට නොඅඩු කාලයක් තුළ සවකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුය.

9. වෙනත් අවශ්‍ය විස්තර කොළඹ 3, බස්නාහිර පළාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත හැකි අතර ටෙන්ඩර් ලියකියවිලි ද මෙහිදී පරීක්ෂාකර බැලිය හැකිය.

10. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ පුහුණු හෝ වේවා නුපුහුණු හෝ වේවා ලාංකික කම්කරුවන් ය. ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම කම්කරුවන් හැකිතාක් දුරට බඳවා ගතයුතුය. සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් හා ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේම කම්කරුවන්ම පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුලත් කරනු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙහි නොවන කම්කරුවන් හෝ, සේවයේ යෙදීමට අධ්‍යාපනාමාත්‍යාංශයේ සථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපනාධ්‍යක්ෂවරයා විසින් අවසර දී ඇති විශෙෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහත කී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළ සේ සලකනු ලැබීමට ද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමට ද යටත් වේ. ලාංකික නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේ හෝ නොවන කම්කරුවන් ඉහත කී අනුමතිය හෝ සම්මුතිය ලබා නොගෙන සේවයේ යෙදීම තහනම්ය.

ඩබ්ලිව්. ඇම්. ඒ. වර්ණසූරිය,
බ. ප. අධ්‍යාපන නිලධාරි තැන.

1959 ජනවාරි මස 20 වැනි දින,
කොළඹ 3, බ. ප. අධ්‍යාපන කාර්යාලයේ දීය.

5. කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාතීමේන්තුවේදී 1959.2.13 දින පස්වරු 2.30ට ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා වවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නාම සහ ඔවුන්ගේ ගණන් පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ට කියවනු ලැබේ.

6. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ඉල්ලීම් ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයේ සිට සති හයක කාලයක් තුළ විවෘතව තැබිය යුතුයි.

7. ටෙන්ඩර් කරුවන් විසින් සේවය සඳහා බඳවා ගත හැක්කේ එම වැඩ කරන ප්‍රදේශයේ පදිංචි පුහුණු හෝ නුපුහුණු ලාංකික කම් කරුවන් පමණී. මෙය කොන්ත්‍රාත්තුවේ කොන්දේසියක් වශයෙන් සලකන බවත් එසේ කිරීමට අසමත් වන කොන්ත්‍රාත් කරුවන් කොන්දේසි කඩකළවුන් හැටියට සලකනු ලබන බවත් සැලකිය යුතුයි. විශෙෂ හේතූන් උඩ අධ්‍යාපන අධ්‍යක්ෂක තැන අධ්‍යාපන අමාත්‍යාංශයේ සථිර ලේකම් තුමා සමඟ සාකච්ඡාකොට ලාංකික නොවන කම්කරුවන් හෝ වෙන ප්‍රදේශවල පදිංචි කම්කරුවන් යෙද වීමට අවසරයක් දුන්නොත් හැර එසේ අවසරයක් නො මැතිව එවැනි කම්කරුවන් සේවයේ යෙදවීම කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට හේතු වන බව සැලකිය යුතුයි. අනුමැතියක් හෝ සම්මුතියක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් හෝ වෙන ප්‍රදේශවල පදිංචි කම් කරුවන් හෝ යෙදවීම තහනම්ය.

8. ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන අවස්ථාවේදී දැනට රජය යටතේ ඇති කොන්ත්‍රාත් සම්බන්ධව පහත සඳහන් පරිදි සහතිකයක් ටෙන් ඩර් කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුයි :—

| වැඩයේ නම | කොන්ත්‍රාත් තුවේ දිනය | කොන්ත්‍රාත් තුවේ මුලු ගණන | වැඩය අවසාන කිරීමට නියමිත දිනය (කල්දීම ඇතිව) | වැඩය සතුටු දයකද අසතුටුදයකද යන වග | දෙපාර්ත මේන්තුවේ ප්‍රාදේශීය ප්‍රධානතැන ගේ අත්සන |
|---|---|---|---|---|---|

ඉහත සඳහන් වන්නේ මවිසින්/අප විසින් කොන්ත්‍රාත් ගෙන තිබෙන සියලුම වැඩවල සම්පූර්ණ විස්තරයක් බැව් සහතික කරමි/ කරමු.

————————,
ටෙන්ඩර්කරුගේ අත්සන.

දිනය :————.

9. ටෙන්ඩර්කරුවන් විසින් පූර්වෝක්ත 8 වෙනි ඡේදයේ අසා තිබෙන විස්තර පිළිබඳ සම්පූර්ණ සත්‍යය සඟවා ප්‍රකාශ කිරීම කොන් ත්‍රාත්තුවක් ඕනෑම අවස්ථාවක අවලංගු කිරීමට ප්‍රමාණවත් වන බැව් සැලකිය යුතුයි.

ඊ. නොගොඩවිතාන,
උෟ. ප. අධ්‍යාපන නිලධාරි තැන.

අධ්‍යාපන කායර්‍ාලය,
බණ්ඩාරවෙල,
1959.1.10.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1959 පෙබරවාරි මස 13 වැනි සිකුරාද පස්වරු 2.30 දක්වා පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| පාසලේ නම | කළයුතු වැඩය |
|---|---|
| 1. කු/ගලගෙදර සි. මි. පා. ... | ගොඩනැගිලි. |
| 2. කු/නිකවැරටිය ජ්‍යෙ. පා. ... | රසායනාගාරය. |

සංලක්ෂ්‍යය.—කු=කුරුණෑගල දිස්ත්‍රික්කය.

2. අංක 1 සඳහා රු. 45,000/-කට හෝ ඊට වැඩි ගණනකට අංක 2 සඳහා රු. 40,000/- ගොඩනැගිලි තැනීම සඳහා අධ්‍යාපන දෙපාර්ත මේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ ලියාපදිංචිව සිටින අයට, අධ්‍යාපන අධ්‍යක්ෂකතුමාගේ කායර්‍ාලයේ (ඒ. සී. ශාඛාව) හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ රු. 100/-ක ඇප මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කරන්නා වූ අයට 1959 පෙබරවාරි මස 12 වන දින පස්වරු 3.30 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මනිඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය භාරගනු නොලැබේ.

3. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර කුරුණෑගල, වයඹ පළාතේ අධ්‍යාපන නිලධාරිතුමාගෙන් හෝ කොළඹ 2, අධ්‍යාපන අධ්‍යක්ෂකතැනගේ කායර්‍ාලයේ (එස්. ඩබ්ලිව්. ශාඛාව) හෝ ලබාගත යුතුය. මුදල් ගෙවීමේ පත්‍ර නිකුත් කරනු ලබන්නේ 2 වන ඡේදයේ සඳහන් වන මුදල් ප්‍රමාණයට ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණකි.

4. පූර්වෝක්ත 2 වන ඡේදයේ සඳහන් වන පරිදි කුරුණෑගල, වයඹ පළාතේ අධ්‍යාපන නිලධාරිතැනගෙන් ලබාගත් ටෙන්ඩර් ෆෝර්ම එවිය යුත්තේ දෙවන පිටපතකුත් සමගය. සියලුම විස්තර හා තොරතුරු කුරුණෑගල, වයඹ පළාතේ අධ්‍යාපන නිලධාරිතැන ගෙන් දැනගත හැකිසි. සැලැස්ම එහිදී බලාගත හැකිය. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර “ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, මලයි වීදිය, කොළඹ 2” යන ලිපිනයට රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය. ප්‍රාදේශිය ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් නොඑවන්නේ නම්, ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කායර්‍ාල සහකාර නිලධාරි තැනට භාරදී, එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබා ගත යුතුය. එසේ භාරදෙන ටෙන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටෙන්ඩර් කරුගේ නමද, ලිපිනයද, වැඩයේ නමද ලියා තිබිය යුතුයි.

5. 1959 පෙබරවාරි මස 13 වන සිකුරාද පස්වරු 2.30 ට කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරණු ලැබේ. එවිට ටෙන්ඩර්කරුවන්ට විවෘත කරන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරණ නිලධාරී තැන විසින්, ටෙන්ඩර්කරුවන්ගේ නම්ද, ප්‍රමාණයන්ද (රේට් ගණන) පැමිනි අයට ඇසෙන්ට කියවනවා ඇත.

6. ටෙන්ඩර් කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසාන කර සති 6කට නො අඩු කාලයක් තුළ සවකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුය.

7. වෙනත් අවශ්‍ය විස්තර කුරුණෑගල, වයඹ පලාතේ අධ්‍යාපන කායර්‍ාලයෙන් දැන ගත හැකි අතර ටෙන්ඩර් ලියකියවිලිද මෙහිදී පරීක්ෂාකර බැලිය හැකිය.

8. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ පුහුණු හෝ වේවා නුපුහුණු හෝ වේවා ලාංකික කම්කරුවන්ය. ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම කම්කරුවන් හැකිතාක් දුරට බඳවා ගත යුතුය. සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් හා ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේම කම්කරුවන්ම පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුළත් කරනු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙහි නොවන කම්කරුවන් හෝ, සේවයේ යෙදීමට අධ්‍යාපනාමාත්‍යාංශයේ සථිර ලේකම්වරයාගේ සම් මුතිය ඇතිව අධ්‍යාපනාධ්‍යක්ෂවරයා විසින් අවසර දී ඇති විශේෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහතකී කොන්දේසි නො පිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩ කළ සේ සලකනු ලැබීමටද, කොන්ත්‍රාත්තුව අවලංගු කරණු ලැබීමටද යටත් වේ. ලාංකික නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේ හෝ නොවන කම්කරුවන් ඉහතකී අනුමැතිය හෝ සම්මුතිය ලබා නොගෙන සේවයේ යෙදීම තහනම්ය.

9. ටෙන්ඩර් පත්‍රිකා ඉල්ලුම් කරණ අවස්ථාවේදී ඔවුන් විසින් භාර ගෙන තිබෙන රජයේ කොන්තරාත් පිළිබඳ වැඩ කටයුතු මනා සේ කෙරීගෙන යන බව සඳහන් කරන රපෝර්තුවක් ඒ වැඩ භාර නිලධාරි වරයාගෙන් ලබාගෙන ඉදිරිපත් කළ යුතුයි. පහත සඳහන් කරණ ඡේදයන් පෙන්නුම් කරණ ෆෝර්මයට අනුකූලව එම රපෝර්තුව සකස් විය යුතුයි :—

“කොන්ත්‍රාත්තුවේ නම :————.

කොන්ත්‍රාත්තුවේ වටිනාකම :————.

කොන්ත්‍රාත්තුවේ අත්සන් තැබූ දිනය :————.

වැඩ අවසන් කළ යුතු දින (කල් ලබා ගෙන තිබේ නම් සඳහන් කළ යුතුයි) :————.

වැඩ සතුටුදායක අන්දමින් කෙරී ගෙන යන්නේද ? :————.

ප්‍රාදේශීය දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ අත්සන හා තනතුර : ————.

ඉහත පෙන්නුම් කරන ලද ලැයිස්තුවෙහි මා විසින් භාරගෙන තිබෙන ලංකා රජයේ සියලුම කොන්ත්‍රාත් ඇතුළත් කර තිබෙන බව ප්‍රකාශ කරමි.”

10. ටෙන්ඩර් පත්‍රිකා ඉල්ලුම් කරන අවස්ථාවේදී කොන්ත්‍රාත් කරුවා විසින් ඔහුට පැවරී තිබෙන කොන්ත්‍රාත්තුවක් පිළිබඳ විස්තර වසන් කර ගැනීම නිසා ඉල්ලුම් කර ඇති කොන්ත්‍රාත්තුව ඕනෑම අවස්ථාවක දී අත්හිටවීමට රජයට අයිතිය තිබේ.

එම්. ඊ. ධම්දාස,
ව. ප. අධ්‍යාපන නිලධාරි.

අධ්‍යාපන කායර්‍ාලය,
කුරුණෑගල, 1959 ජනවාරි 19.

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

**පානදුර, වාද්දුව බටහිර, 1ඩබ්ලිව් වර්ගයේ ගෙවල් 20ක් සහ ළිං 2ක් තැනීම**

පානදුරේ, තොටමුන, වාද්දුව (බටහිර) නාමැති ගමෙහි, 1ඩබ්ලිව් වර්ගයේ ගෙවල් 20ක් සහ ළිං 2ක් තැනීම සඳහා ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1959 පෙබරවාරි මස 27 වෙනි සිකුරාදා පෙරවරු 10 වන තුරු ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිර්මානක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම වැඩි විස්තරද ඔහුගෙන් ලබාගත හැක.

ප්‍රසිඩ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි කර්මාන්ත වැඩ සඳහා රුපියල් 75,000කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි කරන ලද කොන්ත්‍රාත් කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. එම ලියා පදිංචි කරන ලද සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රුපියල් 75ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයවලුන්ට 1959 පෙබරවාරි මස 25 වෙනි බදාදා දවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

රෙ. ලෝ. ආර්නෝල්ඩ,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 4.
ජනවාරි 19, 1959.

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

**කරමඩ, ගෙලිඔය, 1ඩබ්ලිව් වර්ගයේ ගෙවල් 15ක් සහ ළිං 2ක් තැනීම**

ගෙලිඔය, කරමඩ, කුරුඳුවත්ත නමැති ගමෙහි, 1ඩබ්ලිව් වර්ගයේ ගෙවල් 15ක් සහ ළිං 2ක් තැනීම සඳහා ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1959 පෙබරවාරි මස 27 වෙනි සිකුරාදා පෙරවරු 10 වන තුරු ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිර්මානක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම වැඩි විස්තරද ඔහුගෙන් ලබාගත හැක.

ප්‍රසිඩ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි කර්මාන්ත වැඩ සඳහා රුපියල් 50,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි කරන ලද කොන්ත්‍රාත් කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. එම ලියා පදිංචි කරන ලද සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රුපියල් 50ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයවලුන්ට 1959 පෙබරවාරි මස 25 වෙනි බදාදා දවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

රෙ. ලෝ. ආර්නෝල්ඩ,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 4,
ජනවාරි 19, 1959.

---

## රජයේ විදුලි දෙපාර්තමේන්තුව

**ගිස් තෙල් පිප්ප විකිණීමේ ටෙන්ඩර් සම්බන්ධවයි**

ඉහත සඳහන් බඩු විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්‍ෂ 1959ක් වූ පෙබරවාරි මස 18 වන බදාදා පූ. භා. 10 දක්වා රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 540, කොළඹ). විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහිදී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රුපියල් 100ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රුපියල් 5ක මුදලක් ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළවිට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රුපියල් 5හේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 100ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් පෝර්මවලයි. වර්‍ෂ 1959ක් වූ පෙබරවාරි මස 13 වන දින වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්‍ෂ 1959ක් වූ පෙබරවාරි මස 18 වන දින පූ. භා. 10ට රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයෙහිදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඊ. සී. ප්‍රනාන්දු,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540, කොළඹ,
1959ක් වූ ජනවාරි මස 23 වන දිනදීය.

---

## රජයේ විදුලි දෙපාර්තමේන්තුව

**කොළඹ කොට්ඨාශයට විදුලි බලයෙන් ක්‍රියා කරවන වතුර පොම්ප සැපයීමේ සහ භාරදීමේ ටෙන්ඩර් සම්බන්ධවයි**

1. රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු හා කළමනාකාර තැන වෙත ඉහත සඳහන් බඩු සපයා කොලොන්නාවේ පිහිටි ඔහුගේ ගබඩාවට භාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්‍ෂ 1959ක් වූ මාර්තු මස 4 වන බදාදා පූ. භා. 9.30 දක්වා ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 547, කොළඹ) විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහිදී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රුපියල් 100ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රුපියල් 5ක මුදලක් ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළවිට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රුපියල් 5හේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 100ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් පෝර්මවලයි. වර්‍ෂ 1959ක් වූ පෙබරවාරි මස 27 වන දින වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්‍ෂ 1959ක් වූ මාර්තු මස 4 වන දින පූ. භා. 10ට ප්‍රවාහණ සහ වැඩ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයෙහිදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඊ. සී. ප්‍රනාන්දු,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540, කොළඹ,
1959ක් වූ ජනවාරි මස 23 වන දිනදීය.

---

## තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුව

**නුසුදුසු යයි සම්මත කළ භාණ්ඩ මිලට ගැනීමට ටෙන්ඩර**

විවිධ ඉංජිනේරු භාණ්ඩ මිලට ගැනීම සඳහා 1959 පෙබරවාරි මස 24 වෙනි දින පෙරවරු 9.30 වන තෙක් කොළඹ මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ ප්‍රධාන ඉංජිනේරු තැන විසින් ටෙන්ඩර පත්‍ර භාරගනු ලැබේ.

2. මරදානේ විදුලි සන්දේශ ගබඩාවේ ඉංජිනේරු තැනගෙන් විමසා මේ භාණ්ඩ පරීක්‍ෂා කර බැලිය හැක.

3. කොළඹ මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයෙන් ටැලිග්‍රාප් කැෂියර් වෙතින් හෝ කොළඹින් පිට පළාත්වල නම්, ප්‍රදේශයේ තැපැල් ස්ථානාධිපති තැන වෙතින් හෝ, මුදලින් රුපියල් 100ක් තැන්පත් කොට ලබාගත් රිසිට් පත්‍රයක් ඉදිරිපත් කිරීමෙන් 1959 පෙබරවාරි මස 23 වෙනි දින පස්වරු 4 වන තෙක් ප්‍රධාන විදුලි සන්දේශ ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි පෝර්මවල ලියා අනුපිටපතක් ද සමග ටෙන්ඩර පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

4. කවරයේ පිට පැත්තේ "භාණ්ඩ මිලට ගැනීමට ටෙන්ඩර" යනු සඳහන් කර සීල් තැබූ ටෙන්ඩර පත්‍ර කොළඹ මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ ප්‍රධාන විදුලි සන්දේශ ඉංජිනේරු තැන නමට ලිපිනය ලියා රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය. එසේ නැතහොත් ප්‍රධාන ලිපිකරුට භාර දිය යුතුය.

5. විකිණීමට ඇති මුළු භාණ්ඩ තොගයම මිලට ගැනීමට එවන ටෙන්ඩර පත්‍රවල ඒ ඒ භාණ්ඩ විෂයයන් සඳහා සඳහන් කර ඇති මිල ගණන් භාණ්ඩ සවල්පයක් පමණක් සඳහා වන ටෙන්ඩර පත්‍රවල සඳහන් කර තිබෙන මිල ගණන්වලට අඩු වුවත්, මුළු තොගය සඳහා එවන ටෙන්ඩර පත්‍රයට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

6. තෝරාගනු ලැබූ ටෙන්ඩරකරු, ඔහු ගේ ටෙන්ඩර පත්‍රය පිළිගත් බව දන්වා දින 7ක් ඇතුළත ටෙන්ඩරයේ මුළු වටිනාකම මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ ටැලිග්‍රාෆ් කෑෂියර් වෙත මුදලින් තැන්පත් කළ යුතුය. නැතහොත් ඒ මුදලට පෝස්ට් මාස්ටර් ජනරාල්තුමා නමට ලියූ චෙක් පත්‍රයක් ප්‍රධාන විදුලි සන්දේශ ඉංජිනේරු තැන වෙත එවිය යුතුය.

7. 1959 පෙබරවාරි මස 24 වෙනි දින පෙරවරු 10ට ප්‍රධාන විදුලි සන්දේශ ඉංජිනේරු කාර්යාලයේ දී ටෙන්ඩර පත්‍ර විවෘත කරණු ලැබේ. ටෙන්ඩරකරුවන්ට ඒ අවසථාවේ දී එහි පැමිණ සිටිය හැකි ය.

එච්. ඊ. සෙනෙවිරත්න,
පෝස්ට්මාස්ටර් ජනරාල්.

ප්‍රධාන තැපැල් කායසීලය,
කොළඹ.
19.1.1959.

---

## ලංකාණ්ඩුවේ දුම්රිය සේවය

ගැණුම් යෝජනා පත් (ටෙන්ඩර්) භාරගත් දින සිට 1962 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා කාලය තුළ කුමන විධියේ හෝ විස්තර සහිත ආණ්ඩුවේ දැන්වීම් හැර පිළිගත්, විස්තර ඇති වෙළඳ දැන්වීම් ප්‍රදර්ශනය කිරීමේ වරප්‍රසාදය හා තනි හිමිකම පිළිබඳව රජයේ ලියා පදිංචිවූ ගැනුම් යෝජනා කරුවන්ගෙන් (ටෙන්ඩර් කරුවන්ගෙන්) සහ රජයේ ලියා පදිංචි කළ ප්‍රචාරක වෙළඳ සමාගම්වලින් ගැනුම් යෝජනා පත් කොළඹ, තැ. පෙ. 547, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි ප්‍රවාහණ හා රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයේ ගැනුම් යෝජනා මණ්ඩලයේ සභාපති තැන විසින් 1959 පෙබරවාරි මස 18 වැනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාරගනු ලැබේ.

දුම්රිය වාණිජ අධිකාරි තැනගේ කායසීලයෙන් පෝරම කොළ ලබා ගෙන, ගැනුම් යෝජනා පත්‍ර අනු පිටපතක් සහිතව ලියා එවිය යුතුයි. ගැනුම් යෝජනා තැන්පත් මුදලක් වශයෙන් රු. 100ක් දුම්රිය ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කායසීලයෙහි හෝ කොළඹින් බැහැර ඕනෑම දිසාපති කායසීලයක තැන්පත් කොට ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1959 පෙබරවාරි මස 14 වැනි සෙනසුරාදා දවල් 12 වන තෙක් ගැනුම් යෝජනා පෝරම ලබාගත හැක.

විස්තර ප්‍රකාශණය හා මෙම පත්‍රිකාව සමග ගැනුම් යෝජනා පත් ලියුම් කවරයක බහා සිල් තබා, කොළඹ, තැ. පෙ. 547, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි ප්‍රවාහණ හා රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයේ ගැනුම් යෝජනා මණ්ඩලයේ සභාපති තැන වෙත ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. නැතහොත් එම ලියුම් කවරයෙහි ඉල්ලුම් කරන සේවය, නම සහ ලිපිනය සඳහන් කොට ගැනුම් යෝජනා කරු විසින්ම හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් ගැනුම් යෝජනා මණ්ඩලයේ සභාපති තැනගේ බලයලත් නිලධාරියෙකුට ගෙනවුත් භාරදිය හැක. එසේ භාරදීමෙන් පසු ඒ බලයලත් නිලධාරි තැනගෙන් ඒ බවට කුවිතාන්සියක් ලබාගත යුතු වෙයි. ඉහත සඳහන් කෙරුණු වෙලාවට පසුව ලැබෙන ගැනුම් යෝජනා පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

1959 පෙබරවාරි මස 18 වැනි බදාදා පස්වරු 2.30ට ප්‍රවාහණ හා රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශ කායසීලයේදී ගැනුම් යෝජනා පත්‍ර විවෘත කරනු ලැබේ. ගැනුම් යෝජනා කරුවන් කැමතිනම් ගැනුම් යෝජනා පත්‍ර විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට ඉඩදෙනු ලැබේ.

තමන් විසින් ඉල්ලුම් කරනු ලැබූ සේවය භාරගැන්ම සඳහා ගැනුම් යෝජනා පත් භාරගෙන අවසානවූ දින සිට සති තුනක් ගැනුම් යෝජනා කරුවන් බලාපොරොත්තුවෙන් සිටිය යුතුයි.

එක් අඩියක දැන්වීමක ඉඩ ප්‍රමාණයක් සඳහා අවුරුද්දකට ගෙවීමට සතුටු මිල ගණන් සහ එවැනි ප්‍රචාරක දැන්වීම් ඉඩ ප්‍රමාණයන් සඳහා අවුරුද්දකට සහතික කළ හැකි අවම මුදල් ගණන්ත් ගැනුම් යෝජනා කරුවන් විසින් සඳහන් කළ යුතුයි.

වැඩි විස්තර දුම්රිය වාණිජ අධිකාරි තැනගේ කායසීලයෙන් ලබා ගත හැක.

බී. ඩී. රම්පාල,
දුම්රිය සාමාන්‍යාධිකාරි තැන.

1959 ජනවාරි මස 16 වැනි දින,
කොළඹදිය.

## ධීවර අධිකාරිය

**මස් මරන්නන් සඳහා කළුතර දිස්ත්‍රික්කයේ කටුකුරුන්දේ වෙනම වැසිකිළි සහිත ගෙවල් 25ක් සහ ළිඳක් සෑදීම සඳහා ටෙන්ඩර**

මස් මරන්නන් සඳහා කළුතර දිස්ත්‍රික්කයේ කටුකුරුන්දේ වෙනම වැසිකිළි සහිත ගෙවල් 25ක් සහ ළිඳක් සෑදීම සඳහා ටෙන්ඩර, 1959 පෙබරවාරි මස 25 වැනිදා දවල් 12 වන තුරු කොළඹ, සෙනෙට් චතුරශ්‍රයේ කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති මහතා විසින් බාර ගන්නවා ඇත.

2. කොළඹ, ගාලුමුවදොර, ධීවර අධිකාරි තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් එවිය යුතුයි. රුපියල් 50,000ක් හෝ ඊට වඩා ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රජයේ ලියා පදිංචි වූ තැනැත්තන්ට පමණක් 1959 පෙබරවාරි මස 23 වැනිදා පස්වරු 3 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර කරුවන් විසින්, කොළඹ, ගාලුමුවදොර ධීවර අධිකාරියේ ප්‍රධාන කායසීලයේදී හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකදී රුපියල් 100ක් තැන්පත් කළ යුතුයි. ටෙන්ඩර ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේදී එසේ තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

4. වැඩි තොරතුරු ධීවර අධිකාරි තැනගෙන් ලබාගත හැකිය.

ඩී. ඩී. ඊ. ඒ. ද ෆොන්සේකා,
ධීවර අධිකාරි.

1959 ජනවාරි මස 19 වැනිදා
කොළඹ ධීවර අධිකාරියේදීය.

---

## ධීවර අධිකාරිය

**මස් මරන්නන් සඳහා කළුතර දිස්ත්‍රික්කයේ උතුරු කළුතර වෙනම වැසිකිළි සහිත ගෙවල් 25ක් සහ ළිඳක් සෑදීම සඳහා ටෙන්ඩර**

මස් මරන්නන් සඳහා කළුතර දිස්ත්‍රික්කයේ උතුර කළුතර වෙනම වැසිකිළි සහිත ගෙවල් 25ක් සහ ළිඳක් සෑදීම සඳහා ටෙන්ඩර, 1959 පෙබරවාරි මස 25 වැනි බදාදා දවල් 12 වන තුරු කොළඹ, සෙනෙට් චතුරශ්‍රයේ කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති මහතා විසින් භාර ගන්නවා ඇත.

2. කොළඹ, ගාලුමුවදොර, ධීවර අධිකාරි තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් එවිය යුතුයි. රුපියල් 50,000කට හෝ ඊට වඩා ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රජයේ ලියා පදිංචි වූ තැනැත්තන්ට පමණක් 1959 පෙබරවාරි මස 23 වැනිදා පස්වරු 3 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර කරුවන් විසින්, කොළඹ, ගාලුමුවදොර ධීවර අධිකාරියේ ප්‍රධාන කායසීලයේදී හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකදී රුපියල් 100ක් තැන්පත් කළ යුතුයි. ටෙන්ඩර ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේදී එසේ තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

4. වැඩි තොරතුරු ධීවර අධිකාරි තැනගෙන් ලබාගත හැකිය.

ඩී. ඩී. ඊ. ඒ. ද ෆොන්සේකා
ධීවර අධිකාරි.

1959 ජනවාරි මස 19 වැනිදා,
කොළඹ ධීවර අධිකාරියේදීය.

---

## ධීවර අධිකාරිය

**මස් මරන්නන් සඳහා, යාකර සාදන වැසිකිළි සහිත වූ ගෙවල් 18ක් සහ ළිඳක්, මන්නාරම් දිස්ත්‍රික්කයේ පනන් කඩ්කොඩ්ඩුවේ සෑදීම සඳහා ටෙන්ඩර**

මස් මරන්නන් සඳහා, යාකර සාදන වැසිකිළි සහිත වූ ගෙවල් 18ක් සහ ළිඳක්, මන්නාරම් දිස්ත්‍රික්කයේ පනන් කඩ්කොඩ්ඩුවේ සෑදීම සඳහා ටෙන්ඩර 1959 පෙබරවාරි මස 25 වැනි බදාදා දවල් 12 වන තුරු කොළඹ-1, සෙනෙට් චතුරශ්‍රයේ, කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශයේ ටෙන්ඩර මණ්ඩලයේ සභාපති මහතා විසින් භාර ගන්නවා ඇත.

2. කොළඹ, ගාලුමුවදොර, ධීවර අධිකාරි තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් පිටපත් දෙකකින යුක්තව ටෙන්ඩර එවිය යුතුයි. රුපියල් 50,000කට හෝ ඊට වඩා ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රජයේ ලියා පදිංචි වූ තැනැත්තන්ට පමණක් 1959 පෙබරවාරි මස 23 වැනිදා පස්වරු 3 වන තෙක් ටෙන්ඩර ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර කරුවන් විසින් කොළඹ, ගාලුමුවදෙර ධීවර අධිකාරියේ ප්‍රධාන කායඹාලයේදී හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියකදී රුපියල් 100ක් තැන්පත් කළ යුතුයි. ටෙන්ඩර ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේදී එසේ තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

4. වැඩි තොරතුරු ධීවර අධිකාරි තැනගෙන් ලබාගත හැකියි.

ඩී. ටී. ඊ. ඒ. ද පොන්සේකා,
ධීවර අධිකාරී.

1959 ජනවාරි මස 19 වැනිද
කොළඹ ධීවර අධිකාරියේදීය.

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1959 පෙබරවාරි මස 12 වෙනි බෘහස්පතින්ද පස්වරු 2.30 දක්වා, පාවිච්චි කළ නොහැකි බඩු විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1959 පෙබරවාරි මස 12 වෙනි දින පස්වරු 2.30ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපැලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් ටෙන්ඩර් භාරගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියෙකුට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාරදී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපිලේඛන කොළඹ වරාය කොමිෂන් කායඹාලයේදී පරීක්ෂා කළ හැක. රු. 50ක මුදලක් වරාය කොමිෂන් කායඹාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම කොළ ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසිවලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් ෆෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1959 පෙබරවාරි මස 11 වෙනි බදාදා දවල් 12 දක්වා ටෙන්ඩර් ෆෝර්ම කොළ නිකුත් කරනු ලැබේ. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් පාවිච්චි කළ නොහැකි බඩු වරාය කොමිෂන් සීමාවෙන් ඉවත් කිරීමට ප්‍රථමයෙන් රේගුවේ දෙපාර්තමේන්තුවට අය විය යුතු තීරු බද්ද ගෙවිය යුතුය.

ඩී. ජී. දයාරත්න,
වරායේ කොමසාරිස්.

1959 ජනවාරි මස 16 වෙනි දින,
කොළඹ වරාය කොමිෂන් සභා කායඹාලයේදීය.

---

## මිනින්දෝරු දෙපාර්තමේන්තුව

පහත සඳහන් උපකරණ සැපයීම සඳහා සර්වේයර් ජනරාල්තුමා වෙනුවෙන්, කොළඹ වැතැම් වීදියේ පිහිටි සර්වේයර් ජනරාල් කාර්යාලයේ ගබඩා අංශය විසින් 1959 පෙබරවාරි මස 10 වෙනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන අතර, ටෙන්ඩර් කරුවන්ටද පෙනී සිටිය හැක.

උපකරණ :—

| | |
|---|---|
| මැනුම් රිටි | 400 යි |
| ලඹ කකුල් | 250 යි |
| කොමෝඩ් | 12 යි |

මේවායේ සැම්පල්, කොළඹ වැතැම් වීදියේ පිහිටි සර්වේයර් ජනරාල් කාර්යාලයේ ගබඩා අංශයේදී බලාගැනීමට පිළිවන. උපකරණ වල සැලසුම් හා සියලු විස්තර අඩංගු පිටපත බැගින් ටෙන්ඩර් පත්‍ර සමග දෙනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර අනු පිටපත් සහිත විය යුතුයි. තැන්පත් මුදල වශයෙන් රුපියල් 50 ක් ගෙවා, සර්වේයර් ජනරාල් කාර්යාලයේ, ගබඩා අංශයෙන් 1959 පෙබරවාරි මස 9 වෙනි සඳුදා පස්වරු 2 දක්වා ටෙන්ඩර් පත්‍ර ලබාගත හැක.

වැඩි විස්තර සර්වේයර් ජනරාල් තුමාගෙන් ලබාගත හැක.

ඩී. රාසරේට්නම්,
සර්වේයර් ජනරාල්තුමා.

1959 ජනවාරි 12 වැනි දින,
ගබඩා අංශය,
සර්වේයර් ජනරාල් කාර්යාලය,
කොළඹ.

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

11,531 වෙනි අංකය සහ 1958වේ සැප්තැම්බර් මස 25වෙනි දිනය දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළවූ දැන්වීම සම්බන්ධවයි. ලංකා ගමනාගමන මණ්ඩලයට වී. එම්. ඈෆ්. ගුවන් විදුලි ටැලිෆෝන් උපකරණ සැපයීම, සවිකිරීම සහ නඩත්තු කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර බාරගන්නා අවසාන දිනය 1959යේ මාර්තු මස 4වෙනි දා වන බදාදා පෙ. ව. 10 වන තෙක් දීර්ඝ කොට තිබේ.

1959යේ මාර්තු මස 3වෙනි දා වන අඟහරුවාදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

ලංකා ගමනාගමන මණ්ඩලයේ ලේකම්තැන.

1959යේ ජනවාරි මස 13වෙනි දින
කොළඹදීය.

---

## හම්බන්තොට කච්චේරිය

1959 පෙබරවාරි 12 දින උදේ 9.30 දක්වා, වරාපිටිය-තලපත් කන්ද පාරේ බෝක්කුවක් තැනීම සඳහා, සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර මවිසින් භාරගනු ලැබේ.

රජයේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් පමණක්, හම්බන්තොට දිසාපති තැන නමට රුපියල් 10ක මුදලක් කච්චේරියේ තැන්පත් කර, කුවිතාන්සියක් හම්බන්තොට කච්චේරියේ ග්‍රාම සංවර්ධන අංශය වෙත, 1959 පෙබරවාරි 7 දිනට පෙර ඉදිරිපත් කර ලබාගන්නා ටෙන්ඩර් පත්‍රිකාවල පමණක් ඉල්ලුම් කළ යුතුය.

මේ පිළිබඳ වෙනත් අවශ්‍ය කරුණු හම්බන්තොට කච්චේරියේ, ග්‍රාමසංවර්ධන අංශයෙන් විමසා දැනගත හැකිය.

ටී. සිවඥානම්,
හම්බන්තොට දිසාපති.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

හැඳුනාවේ මධ්‍යම පාඨශාලාවේ ඉතිරි වැඩ සඳහා 1958 වේ දෙසැම්බර් 5 වෙනි දින අංක 11,608 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වූ ටැන්ඩර් දැන්වීම මෙයින් අවලංගු කරනු ලැබේ.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

1959 ජනවාරි 20 වැනි දින,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---

හෝමාගම යුද්ධ හමුදා කඳවුරේ රෙජිමේන්තු ප්‍රධාන කාර්යාලය, කෑම කන කාමර, කෝකියන්ගේ නිවාස, සහ මුර ගෙයක් සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වෂී 1959යේ පෙබරවාරි මස 18 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. හෝමාගම ආ. වැ. දෙපාර්තමේන්තුවේ නිර්මාණ ඉංජිනේරු තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වෂී 1959යේ පෙබරවාරි මස 6 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ 'ඒ' 'බී' සහ 'සී' යන කොටස් යටතේ ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 250ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඹාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 59.1.20.

# බඩු බාහිරාදිය විකිණීම්

## වල්ලමක් විකිණීම උදෙසා

—W. T. 163, A. IALIS, V. A. T. T.

වත්තාලෙයේ දීය

මෙහි පහත සඳහන් වල්ලමක් 1959 පෙබරවාරි මස (6) හය, වෙනි දින පෙරවරු (10) දහයට වත්තාලයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :—

දිග අඩි 28යි ;
පළල අඩි 2, අඟල් 9යි ;
ගැඹුර අඩි 1, අඟල් 3යි ;

සී. ලූමිකාන්ස්,
නැව්කාවලට සිදුවූ හෙදිසි අනතුරු නොහොත් විනාශවූ
දේ පල භාරගැනීමේ නිලධාරී තැන.

රජයේ රේගුව,
මන්නාරම,
10. 1. 59

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## කොළඹ ආදුරුප්පු වීදියේ තනා ඇති සාප්පු ගොඩනැගිලි කුලියට දීම

කොළඹ ආදුරුප්පු වීදියේ තනා ඇති සාප්පු ගොඩනැගිලි කුලියට දීම සඳහා 1959 පෙබරවාරි මස 7 වැනි සෙනසුරාදා පෙරවරු 10 ට ලංකා බැංකු ගොඩනැගිල්ලේ තුන්වැනි මාලයේ පිහිටි මගේ කාර්යාලයේ දී වෙන්දේසියක් පැවැත්වේ.

සාප්පු ගොඩනැගිලි 2 ක් ආදුරුප්පු වීදියට මුහුණ ලා ඇති අතර සාප්පු ගොඩනැගිලි 4ක් සිරිපිනා පටුමාවතට මුහුණ ලා පිහිටා ඇත. සාප්පුවක විශාලත්වය හතරැස් අඩි 600 ක් පමණ වේ. ආදුරුප්පු වීදියට මුහුණ ලා ඇති ගොඩනැගිල්ලක මාසික කුලිය රුපියල් 150 ක් වන අතර, සිරිපිනා මාවතට මුහුණ ලා ඇති ගොඩනැගිල්ලක කුලිය රුපියල් 130ක් වේ. ඉල්ලුම්කරුවන් විසින් ගෙවිය යුතු අඩුම මූලික මුදල රුපියල් 500 ක් වේ.

ඒ ඒ වර්ගයට අයත් ගොඩනැගිලි සඳහා ඉහළම ගණනක ලන්සුව ඉදිරිපත් කරන අයට ඒවායේ අයිතිය පවරා දෙනු ලැබේ. ඒ ඒ වර්ගයට ගෙවිය යුතු අඩුම මූලික මුදලට වඩා පහළ ලන්සු පිළිගනු නොලැබේ. ඉල්ලුම්කරුවන් ඉදිරිපත් කරනු ලබන යම්කිසි ලන්සුවක් පිළිගැනීමට පෙර ජාතික නිවාස කොමසාරිස් ලන්සුව ඉදිරිපත් කරන ඉල්ලුම්කරුගේ නියම සුදුසුකම් ගැන හා ගොඩනැගිලි කුලියට දීමේ කොන්දේසි අනුව ක්‍රියා කිරීමට ඔහුට ඇති හැකියාව ගැන සෑහීමකට පත් විය යුතුවා පමණක් නොව වඩා අඩු ලන්සුවක් පිළිගැනීමේ අයිතියද තමන් කෙරෙහි තබා ගනු ලැබේ.

තෝරාගනු ලැබූ ඉල්ලුම්කරු ඔහුගේ ලන්සුව පිළිගත් වහාම ලන්සුවේ වටිනාකමෙන් සියයට 25 ක් සහ තුන් මසක කුලී ප්‍රමාණය තැන්පත් මුදලක් සේ කොමසාරිස් තුමාට ගෙවිය යුතුය. ඉතිරි මුදල සති දෙකක් තුළදී නොගෙව්වහොත්, තැන්පත් කරන ලද මුදල රාජසන්තක වේ. තැන්පත් කරන ලද ලන්සුවේ වටිනාකම ආපසු ගෙවනු නොලැබේ. තෝරාගනු ලැබූ ඉල්ලුම්කරු තමන්ගේ ලන්සුවේ වටිනාකම සහ තුන් මසක කුලී ගෙවූ පසු පහත සඳහන් කොන්දේසිත් අඩංගු ගෙවල් කුලී ගිවිසුමකට අත්සන් තැබිය යුතුය :—

(අ) ජාතික නිවාස කොමසාරිස්ගෙන් ලියවිල්ලකින් ලබාගත් අනුමතිය නොමැතිව තෝරාගත් ඉල්ලුම්කරු ගොඩනැගිලි වල පදිංචිකරුවන්වූ විට තමන්ට කුලියට දෙන ලද ගොඩනැගිල්ල වෙනත් අයකුට කුලියට දීම, විකිණීම, තෑගි කිරීම, උගස් කිරීම හෝ වෙනයම් විදියකින් ඔහුගේ අයිතිය අන් අයකුට පැවරීම නොකළ යුතුය.

(ආ) තෝරාගත් ඉල්ලුම්කරු ගොඩනැගිල්ලේ පදිංචිකරුවූ විට එම ගොඩනැගිල්ල සිය වියදමෙන් අළුත්වැඩියා කොට සෑම අවස්ථාවේම යථා තත්ත්වයෙන් තබාගත යුතුවා පමණක් නොව, වරිපනම් හා අයබදුද ගෙවිය යුතුය. තමන්ට කුලියට දී ඇති ගොඩනැගිල්ල වටා තාප්පයක් හෝ වැටක් ඉදි කොට එය යථා තත්ත්වයේ තබාගත යුතුය.

(ඇ) තෝරාගත් ඉල්ලුම්කරු ගොඩනැගිල්ලේ පදිංචියට පැමිණි පසු ඔහුට පවරා ඇති පදිංචිය හමාර වූ විට එම ගොඩනැගිල්ල ඊට සවිකර ඇති සෑම දෙයක්ම මනා තත්ත්වයකින් අමතරව ඉදිකර ඇති ගොඩනැගිල්ල සහ වැඩි දියුණු කර ඇති කොටස්ද සමඟ ජාතික නිවාස කොමසාරිස් තැනට බාර දිය යුතුය. යම් අමතර කොටස් ඉදි කර ඇතොත් ඒ සඳහා කිසිම අලාභයක් පදිංචිකරුට ගෙවනු නොලැබේ.

(ඈ) අවුරුදු පහකට වරක් අවශ්‍ය වුවොත් ගෙවල් කුලී සංශෝධනය කරනු ලැබේ. මේ සම්බන්ධ වැඩි විස්තර ජාතික නිවාස කොමසාරිස් තැනගෙන් ලබාගත හැක.

ආර්. ඇල්. ආර්නෝල්ඩ,
ජාතික නිවාස කොමසාරිස් තැන.

කොළඹ.

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### නිවාස සඳහා ඉල්ලුම් පත්‍ර—දොඩම්ගහහේන නිවාස යෝජනා ක්‍රමය—අංගොඩ

අංගොඩ අයි. ඩී. එච්. බස් නැවතුම්පොලට නුදුරුව දොඩම්ගහහේනේ සාදා ඇති කුලියට සින්නවීමේ ක්‍රමයට දිය හැකි අඩු කුලී ගෙවල් සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ලංකාවේ පුරවැසියන් ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

(අ) තමන්ගේ සහ තමන්ගේ භාර්යාව/පුරුෂයාගේ සම්පූර්ණ මාසික ආදායම රුපියල් 200 ට නොවැඩි අය.

(ආ) දැන්වීම පළවන දිනයට දෑවුරුද්දකට නොඅඩු කාලයක් කොළඹ නගර සභා ප්‍රදේශය ඇතුළත හෝ නිවාස යෝජනා ක්‍රමයේ සිට සැතපුම් 5 ක අර්ධ විෂ්කම්භයක් ඇති ප්‍රදේශයක පදිංචිව හෝ රැකියාවෙහි යෙදී සිටි අය.

(ඇ) තමන්ගේ නමින් හෝ තමන්ගේ භාර්යාවගේ/පුරුෂයාගේ නමින් හෝ තමන්ගෙන් යැපෙන ළමයකුගේ නමින් හෝ ගෙයක් නොමැති අය.

සෑම ගෙයක්ම පිහිටා ඇත්තේ දළ වශයෙන් පර්චස් 15 ක් පමණවූ ඉඩමකය. ගෙවල් වල වහල උළු සෙවිලි කර ඇති අතර බිම සිමෙන්තියෙන් සාදා ඇත. එක් ගෙයකට ඉස්තෝප්පුවක්, කාමර දෙකක්, මුළුතැන් ගෙයක් සහ ජල මුද්‍රිත වැසිකිළියක් බැගින් තිබේ. බීම පිණිස ජලය ළිං වලින් ලබාගත හැකි අතර, නෑම පිණිස ගෙවල් කට්ටියකට එක බැගින් සුදුසු ඔබසපානයන් හි නාන ළිං සැපයෙනවා ඇත.

අවුරුදු 25 කින් මුළු මුදල ගෙවී යන පරිදි ගෙයක කුලිය මසකට රුපියල් 21.50 ක් පමණ වේ.

ගෙහි පදිංචි කාරයාට ගෙයි නීත්‍යානුකූල අයිතිය පැවරෙන්නේ මුදල සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් කළ විටය. ගෙයි පදිංචිකාරයා යම්කිසි අවස්ථාවක ශේෂව තිබෙන මුදල එකවිටම ගෙවා දැම්මොත් සමඟම ගෙයි නීත්‍යානුකූල අයිතියත් ඔහුට පවරා දෙනු ලැබේ. ගෙයි පදිංචියට ගියද සිට ගෙයි පදිංචිකාරයා විසින්ම ගෙය නඩත්තු කළ යුතුවා පමණක් නොව, ගෙවල් කුලියද වරිපනම් හා වෙනත් ගාස්තුද ගෙවිය යුතුවේ.

ගෙවල් වල පදිංචිය සඳහා සුදුසු අය තෝරාගනු ලබන්නේ ජාතික නිවාස කොමසාරිස් වරයා විසිනි. මොනම අයුරු පෙළඹීමක් ඇති වුවහොත් එයම ඉල්ලුම්කරුවකු නුසුදුස්සකු වීමට කාරණයක් වන්නේය.

කොළඹ ජාතික නිවාස දෙපාර්තමේන්තුව මේ සඳහා පිළියෙල කර ඇති ඉල්ලුම් පත්‍ර මගින් ඉල්ලුම් කළ යුතු අතර එකී ඉල්ලුම් පත්‍ර 1959 පෙබරවාරි මස 28 වන දිනට හෝ ඊට පෙර ජාතික නිවාස කොමසාරිස් තැන වෙත ලැබෙන සේ එවිය යුතුය. ඉල්ලුම් පත එවා දින 21 ක් තුළදී එය ලැබුණු බවට දැන්වීමක් නොලැබුණොත් ඒ බැව් දන්වා තැපැල් කාර්යාලයේ ලියා පදිංචි කරන ලද ලිපියකින් මෙම දෙපාර්තමේන්තුවට දැන්විය යුතුය. ඉල්ලුම් පත් බහා එවනු ලබන පිට කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ "දොඩම්ගහහේනේ ගෙවල් සඳහා ඉල්ලුම් පත්" යැයි සඳහන් කළ යුතුය.

ආර්. ඇල්. ආර්නෝල්ඩ,
ජාතික නිවාස කොමසාරිස් තැන.

කොළඹ.

# විශෙෂ නිවේදනයයි

1959 පෙබරවාරි 4 වැනි බදාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1959 පෙබරවාරි 6 වැනි දින නිකුත්කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1959 පෙබවාරි 2 වැනි සඳුදා පස්වරු 4 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1958 ජනවාරි 16 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරණ ලදී.